
තැපැල් කර්යාලයේදී ලියාපදිංචි කරන ලදී QD/61 නිවුස් 2015

# ශක්තිය

ප්‍රගතියේ ජනහඬ කැටුව එන පුවත්පත

වෙළුම 13 කලාපය 08 2015 ඔක්තෝම්බර් මිල රු.20/-



# අධිරාජ්‍යවාදයේ වටලෑම.

**අපගේ මාතෘ භූමිය වසර 30 කට පසුව නැවතත් ඇමරිකාව ප්‍රමුඛ විදේශ බලවතුන්ගේ ආධිපත්‍යයට හා අධිරාජ්‍ය ගැති ප්‍රතිගාමි, දක්ෂිණාංශික යූ.එන්.පී. සතුරු බලවේගයට නතු වී ඇති බව මධ්‍යස්ථ දේශපාලන නිරීක්ෂකයන්ගේ මතය වී තිබේ.**

1977 සිට 2005 වනතුරු පැවති අධිරාජ්‍යවාදයට නතුවූ දේශපාලන ආර්ථික ප්‍රතිපත්තිය පොදු ජනතාව වෙත නැඹුරු වූ ජනතාවාදී ප්‍රතිපත්තියක් දෙසට හැරවූ, මහින්ද මහතා නායකත්වය දුන් රජය, අධිරාජ්‍යවාදීන් කලක සිට සිදු කරන ලද කුමන්ත්‍රණයෙන් කඩා බිද දමා ඔවුන්ට ගැති රූකඩ පාලකයෙකු සහ ආණ්ඩුවක් බලයට පත් කර ගෙන ඇති බව විශ්ව විද්‍යාල ආචාර්ය සංගමයේ නියෝජිතයෙකුගේ මතය වී තිබේ.

අධිරාජ්‍යවාදීන් මුළු ලෝකයම තම අණසකට නතු කර ගැනීම සඳහා ජාත්‍යන්තර වශයෙන් සිදු කරන මෙහෙයුමට ලංකාවේ ඡන්ද මෙහෙයුම සම්බන්ධ කරමින්, ඉතා සුක්ෂම ලෙස ශ්‍රී.ල.නි.ප භේද කරමින් සිරිසේන මහතා හරහා දක්ෂිණාංශික රනිල් මහතා වෙත බලය මාරු කිරීමට ඔවුන් සමත් වී ඇති බව දේශපාලන නිගමනය වී තිබේ. එම මෙහෙයුම සඳහා අධිරාජ්‍යවාදයට විරුද්ධව ව්‍යාජ රංගනයක නිරත වූ චම්පික, අනුර කුමාර ඇතුළු ඊනියා වාමාංශික කාරයන් ද රනිල් සමග සන්ධාන ගත කිරීමට අධිරාජ්‍යවාදය සමත් වූ බව වෘත්තීය සමිති නායකයෙක් පෙන්වා දෙයි.

කෙසේ වුවද, අධිරාජ්‍යගැති මෙම හවුල් ආණ්ඩුව හැසිරෙන ආකාරය දෙස බැලීමේ දී අප රට නැවත ගමන් කරමින් තිබෙන්නේ, ප්‍රජාතන්ත්‍රවාදය කනපිට හැරවූ ජේ.ආර්. පාලනයක් වෙත බව ශ්‍රී.ල.නි.ප ප්‍රබල නායකයෙකු ශක්තියට පැවසීය.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය වෙත ඇමරිකාව විසින් ගෙන එන ලද යෝජනාව සම්මත කර ගැනීම සඳහා ලංකා ආණ්ඩුවේ එකගතාවය ලියවාගෙන එමගින් අපගේ ජාතික නිදහසත්, සෛවරීභාවයත් ඇමරිකානු අධිපත්‍යයටය පාවා දී ඇතැයි පසුගිය දා පැවති පුවත්පත් සාකච්ඡාවකදී පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර සහෝදරයා පැවසිය. එසේම රනිල් වික්‍රමසිංහ අගමැති හා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති ප්‍රජාතන්ත්‍රවාදය පෙන්වමින් ප්‍රජාතන්ත්‍රවාදයට ඉඩ අහුරන ක්‍රියාවලියක නිරත වී සිටින බව මානව හිමිකම් හා ප්‍රජාතන්ත්‍රවාදය රැක ගැනීමේ නිත්‍ය සංසදයේ නීතිඥවරු ශක්තියට පැවසීය.

රනිල් අගමැති වූ විගසම මාධ්‍යවේදීන්ට විවෘතවම සිදු කල තර්ජනය හා පාර්ලිමේන්තුවේදී හා ඉන් පිටත දී ඔහු මාධ්‍යවේදීන් කෙරෙහි දැක්වූ දැඩි ආකල්පයද පාර්ලිමේන්තුව තුළ ඔහුගේ හැසිරීමද අනුව ඉදිරියේ ප්‍රජාතන්ත්‍රවාදය කුමන හැඩකයට පරිවර්තනය වේ දැයි කිසිවෙකුටත් සිතා ගත නොහැකි තරම් බරපතල බව එම නිතිඥවරුන්ගේ මතයයි.

තමන්ට අවනත නැති පළාත් පාලන ආයතන 2015 මැයි මස සිට නිළධාරි පාලනයට යටත් කොට ජනතා පරමාධිපත්‍යයට පයින් ගැසූ රනිල් මෛත්‍රී හවුල පාර්ලිමේන්තුවට පමණක් හිමිව තිබූ, ශ්‍රේෂධාධිකරන විනිසුරුවරුන් ඉවත් කිරීමේ බලය ජනාධිපති බලයේ ආධිපත්‍යයෙන් යටකරමින් අධිකරණයේ ස්වාධිනත්වයද පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවයද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවද උල්ලංඝණය කර ඇතැයි එම නීතිඥවරු ප්‍රකාශ කරයි. මහ මැතිවරණයෙන් පරාජය වූ අපේක්ෂකයන් ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට ගෙන ඒම මගින් ජනතා පරමාධිපත්‍යයේ සර්වජක ඡන්ද බලය දූෂණය කර ඇතැයි ඒ පිළිබඳව පවරා ඇති නඩුවලට පෙනි සිටින නිතීඥයෝ පවසති. මෙය ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල කල මරු පහරක් බව සමාජවාදී ජනතා පෙරමුණේ නායකයේක් ශක්තියට පැවසිය.

මේ අතර ජීවන වියදම ඉතා වේගයෙන් ඉහල යද්දී තේ දළු මිලද රබර් මිල ද, වී මිල ද මැණික් මිලද කුරුදු මිල ද පහලට වැටෙමින් ඇත. මෙය එම ජනතාවට මහත් ව්‍යසනයක් වී ඇති බව වාර්තා වේ. එසේම පසුගිය

02 පිටුවට

## ආණ්ඩු විරෝධී විපක්ෂ බලවේගය ගොඩනැඟේ

**වෙල්ගම-දිනේශ්-විමල්-වාසුදේව-තිස්ස-කොල්ලුරේ-අසංක බන්දුල-ගම්මන්පිල-පොඩි අප්පුහාමි පෙරමුණ ගනී**

ප්‍රක්ෂ කීපයකින් සමන්විත ආන්ඩු විරෝධී විපක්ෂ සන්ධානය ඒකාබද්ධ ක්‍රියාමාර්ගයකට අවතීර්ණවීමට තීරණය කර ඇති බව ශක්තියට වාර්තාවේ.

ආණ්ඩුවේ අනුග්‍රහය ඇති නිල විපක්ෂය ලෙස සිටින දෙමළ ජාතික සන්ධානය හා ජනතා විමුක්ති පෙරමුණ යූ.ඇන්.පී. - මෛත්‍රී. අධිරාජ්‍ය ගැති වැඩපිලිවෙලේ අත්උදව්කරුවන් ලෙස සිටින අතර, ඔවුන් ආණ්ඩුව, අධිරාජ්‍යවාදය සමඟ ඇතිකරගත් ගිවිසුම හෝ පොදු ජනතාවට එරෙහිව නැගන පියවරයන් ගැන ප්‍රශ්න ඇවන්ගාඩ් කතා වලට යටකර තබයි.

එනිසා නිල පිළිගැනීමක් නොමැති වුවත් විපක්ෂයේ ප්‍රබල මතයක් හසුරුවන ශ්‍රී ල.නි.ප. මන්ත්‍රිවරුන් ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානය ඒකාබද්ධ පෙරමුණක් ලෙස කටයුතු කිරීමට තීරණය කිරීම ජනතාව ලැබූ විශිෂ්ට ජයග්‍රහනයකි. ඒ අනුව ඇමරිකාව, ලංකාව එක්ව සම්මත කරගත් යෝජනාවටද එමගින් අපගේ ජාතික නිදහස පාවාදීමටද, විරුද්ධව පලමු පුවත්පත් සාකච්ඡාව පසුගියදා අභයාරාමයේදි පැවැත් වින.

## තේ, රබර්, වී සහතික මිළ ගැන ආණ්ඩුව දෙගිඩියාවෙන්


මහින්ද රජය විසින් වී, තේ, රබර් මිල සඳහා අවම සහතික මිලක් ක්‍රියාත්මක කිරීමෙන් පසු ඇති වූ යූඇන්පී සභාග රජය සිය අතුරු අය වැයෙන් එකී මිල ගණන් ඉහළ දැමූවේ ඡන්ද ගුංඩුවක් ලෙස බව සංධනායේ මංත්‍රීවරු එදා පල කලහ. කියන ලද පරිදිම මහා මැතිවරණය දක්වා දෙමසක් පමණ එකී මිල ගණන් ගෙවා මැතිවරණයෙන් පසු යූඇන්පී සභාග රජය ක්ෂනිකව එම ගෙවීම් නතර කළාය. සහතික මිලට, එනම් වී කිලෝවක් රු. පනහ ගණනේ මිලදී ගැනීම මැතිවරණ අවස්ථාව වන විටත් කඩා වැටී තිබිණ. එනිසාම වෙළද පොලෙහි වී කිලෝවක මිල රු.25 දක්වා පහල වැටුනේය.

මෙම තත්ත්වය නිසා වී, තේ, රබර් නිපදවන පළාත් වල කුඩා ඉඩම් හිමි ජනයා මහත් අහේනියකට පත් විය. පහත රට තේ කම්හල් 14 ක් පමණ වසා දමන ලද අතර රබර් කිරි කැපීම බොහෝ පිරිස් විසින් අත් හැර දමා ඇත. මේ හේතුවෙන් රට පුරා ජනයා අතර බුර බුරා නගින් විරෝධය හමුවේ රජය නැවත තේ රබර් සඳහා වහාම සහන මිල ලබා දීමට ක්‍රියා කර ඇති බව අමාත්‍යවරයා පැවසුවේ ඔක්තොබර් 7 වෙනිදා මේ පළිබදව පාර්ලිමේන්තුවේ පැවැත්වුනු විවාදයේදී අමාත්‍යවරයාගේ කතාව අතරතුර වාසුදේව සහෝදරයා විසින් නැගූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන්ය.

වර්තමාන රජයේ ආර්ථික ප්‍රතිපත්තිය අනුව සහනාධාර කපා දැමිය යුතු බටව අග්‍රාමාත්‍ය තුමා ප්‍රමුඛ මූල්‍යවාදී පිරිස් කල්පනා කරන අතර සහනාධාර කපා ජනාතා උද්ඝෝෂණය පෙරට පැමිනිය හොත් ආණ්ඩුව ගෙන යෑමට අපහසු තාවක් මතු වන බව ශ්‍රීලංකා නිදහස් පකෂයට සම්බන්ධ අමාත්‍යවරුන් කල්පනා කරයි. යූඇන්පී, ශ්‍රිලනිප පකෂ දේකේම ජනතාවට සමීප මන්ත්‍රීවරුන්ගේ අදහස වී ඇත්තේ වගා සහනාධාර නිසියාකාරව නොලැබෙන්නේ නම් ඔවුන්ට ගමේ සිට දේශපාලනය කිරීමට නොහැකි වන බවයි. එක්වර වගා සහනධාර කපා නොදැමීමටත් මිල තත්ත්වය යම් ආකාරයෙන් ඉදිරියේදී ස්ථාවර වීමත් සමඟ එම සහන නැවැත්වීමට හැකි බැවින් කෙටි කාලීනව ඉදිරි මාස කිහිපයකටවත් යෝජිත සහනාධාර ක්‍රියාත්මක කළ යුතු බව යූඇන්පී පසු පෙල මංත්‍රීවරුන් ද ප්‍රබලව ප්‍රකාශ කර ඇත.

**ලංකාවට දෙමුහුන් අධිකරණයක්**
**- ප්‍රවෘත්තියක්**

**මුන්ගේ ආණ්ඩුවත් දෙමුහුන්,**
**නඩුත් දෙමුහුන්**
**- ලැන්ටි**



ශක්තිය
49 1/1, විනයාලංකාර මාවත, කොළඹ 10.
දුරකථනය: 011 2684820
ෆැක්ස්: 011 2684820
විද්‍යුත් තැපැල : Shakthiya85@gmail.com
www.shakthiya.org

## පාර්ලිමේන්තුව නිර්වින්දනය වෙලා.

රටේ පාර්ලිමේන්තුව කෙරෙහි ජනතාව තුළ තිබු විශ්වාසය ගෞරවය හා සැලකිල්ල මේ මොහොතේ නැති වෙලා ගිහින්. උත්තරීතර භාවය හොරු අරන්. එසේ වුයේ කෙසේද යන්න ගැනත්, ඊට වගකිවයුත්තෝ කවුද යන්න ගැනත් ජනතාව හොදාකාර දනී.
පාර්ලිමේන්තුවේ ස්වකීය මන්ත්‍රීවරයා තෝරා එවනුයේ ජනතාවයි. ජනතාව ප්‍රතික්ෂේප කල ජනතා විශ්වාසය බිද වැටුණු ඇතැම් පිරිස් හිරිකිතයක් නැතිව ජාතික ලැයිස්තුවේ මහජන නියෝජිතයන් ලෙස පාර්ලිමේන්තුවේ අසුන් ගනී. මෙය ජනතා පරමාධිපත්‍ය කෙලෙසමින් සමස්ථ පාර්ලිමේන්තු සම්ප්‍රදායටම එල්ල කල හැකි මහා කුළු ගෙඩි ප්‍රහාරයකි.

ලංකාවට සර්ව ජන ඡන්ද බලය හිමිවීමෙන් පසු ආරම්භ වු රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිට මේ දක්වා වරින්වර මන්ත්‍රීවරු බිහිවූහ. එසේ බිහිවු සෑම පාර්ලිමේන්තුවකින්ම සාපේක්ෂව ජනතා පරමාධිපත්‍ය ප්‍රදර්ශනය වූහ. නමුත් 2015 අගෝස්තුවේ පිහිටුවා ගත් පාර්ලිමේන්තුවෙන් එම තත්වය සම්පුර්ණයෙන්ම වෙනස් විය. එය සම්ප්‍රදායට පටහැනිව ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහි වෙමින් ස්වකීය අභිමතාර්ථය, මත පරාජය වු, ජනතාව ප්‍රතික්ෂේප කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු තෝරා ගැනීමෙන් ජනතා පරමාධිපත්‍ය කෙලෙසා දැමුහ.

වත්මන් පාර්ලිමේන්තුවේ විපක්ෂය සම්බන්ධව ද මතුව තිබෙනුයේ ව්‍යාකූල තත්වයකි. එය ද ගැටළු සහිතය. එය පාර්ලිමේන්තු සම්ප්‍රදායට පටහැනිය. එය සැබෑ විපක්ෂයක් ද යන්න නිදහස් මතධාරීන් පවා ප්‍රශ්න කරති. සැබෑ විපක්ෂයක් විය යුත්තේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව ජනතාවගේ ඡන්දයෙන් බලයට පත්කර ගත නොහැකි වු පක්ෂයයි. ඒ බැව් පෙන්වා දීමට තරම් අටුවාටිකා අවශ්‍ය නැත. පසුගිය මැතිවරණයේදී එක්සත් ජනතා නිදහස් සන්ධානයට ලැබුණේ මන්ත්‍රීධූර අනු පහකි. ද්‍රවිඩ ජාතික සන්ධානයට ලැබුණේ මන්ත්‍රී ධූර දහසයක් පමණි. මෙම පසුබිම මත විපක්ෂය වනුයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයයි. මෙහිදි ආණ්ඩුවට සම්බන්ධ නොවු කොටස වෙන්කොට ඔවුන්ගේ විපක්නායකට ද අවස්ථාව සලසා දිය යුතුව තිබුණි. නමුත් එය ඉටු නොවුනි. පාළු ගෙයි වළං බින්ද වගේ. අධිරාජ්‍යවාදීන්ගේ සැලසුම් අනුව, ආණ්ඩුව සියළු ලෝ දනගේ ගෞරව බහුමානයට පාත්‍ර වු පාර්ලිමේන්තු සම්ප්‍රදාය මෙසේ කෙලෙසා දැමුහ. අපි ජාතිවාදයෙන් බැහැර වු ද්වේශ සහගත හැගීම් පිටු දකින්නෝය. නමුත් ප්‍රජාතන්ත්‍රවාදි ඇදුම් උනා දැමීමට ඉඩ නොදෙමු. ජනතාවගේ පරමාධිපත්‍ය බලය සරදමට ලක් නොකරමු.

පාර්ලිමේන්තු සම්ප්‍රදායට හා ව්‍යවස්ථානුකූල ප්‍රජාතන්ත්‍රවාදී පිලිවෙතින් බැහැරව කටයුතු කිරීම පාර්ලිමේන්තුව නිර්වින්දනයට ලක් කිරීමකි. වත්මන් පාලකයෝ 2015 වසරේ මුල් භාගයේදී පාර්ලිමේන්තු සම්ප්‍රදාය සුනු විසුනු කරලමින් එම පාර්ලිමේන්තුව අත්තනොමතිකව විසුරුවෝය. ගැටළු සහගත තත්වයක් උදා වු පමණින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම ප්‍රශ්නයෙන් පැන යාමකි. ජනතාවගේ අයිතිය පැහැරගැනීමකි. බලය අනිසි අයුරින් උපයෝගි කර ගැනීම ද ආඥාදායකත්වයයි.

පසුගිය වකවානුවේ සුළුතරය රජකරවු බව පෙනි යන්නකි. දේශපාලන ජිල්බෝල දමමින් බහුතරයේ ඇතැමුන් වසගයට ගෙන මෙරට පාලනය ගෙන ගියහ. ඉන් පැහැදිලි වනුයේ ප්‍රජාතන්ත්‍රවාදය වල් වැදී ආඥාදායකත්වය ඉස්මතු වී ජනතාවගේ සර්ව ජන ඡන්ද බලය පවා අවතක්සේරුවට ලක්වෙමින් තිබෙන බවට ජාත්‍යන්තරයට ද ඒත්තු ගොස් තිබෙන බවය.

මෙවැනි පසුබිමක් තුල ජනතා අපේක්ෂාව වනුයේ ප්‍රජාතන්ත්‍රවාදී පිරුවටය පොරවාගත් නාමික පාර්ලිමේන්තුවක් නොවෙයි. වත්මන් පාලකයෝ සිදු කරමින් සිටිනුයේ ප්‍රජාතන්ත්‍රවාදය හා පාර්ලිමේන්තු සම්ප්‍රදාය ජනතාවට එපා කරවා වෙනත් විකල්ප මාර්ග සදහා ජනතාව පෙළඹවීමටයි. එය පාර්ලිමේන්තුවේ ඉතිහාසයෙන් නැගෙන මරළතෝනියයි.



## ආර්ථිකයේ දස මහා දෝෂ පොදු ජනයාගේ කරපිටට

# රුපියල පහල බසී ආනයන භාණ්ඩ මිල ඉහල නගී

ඉකුත් සැප්තැම්බර් මාසය සම්බන්ධයෙන් ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සිදු කරන ලද විශ්ලේෂණය පෙන්වනුයේ ආනයනය ඉතා විශාල ලෙස අඩු වී ඇති බවත් ඒ හෙයින් වෙළද ශේෂයේ 2015 සැප්තැම්බර් මස හිගය සැලකිය යුතු ලෙස අඩු වී ඇති බවය. මෙයට ප්‍රධාන ලෙස හේතු වී ඇත්තේ රථ වාහන ආනයනය ලීසිං හා වරපත් සම්බන්ධයෙන් රජය විසින් පැනවු යම් සීමා කිරීම් හා නියාමනයන් මෙන්ම ඩොලරයට සාපේක්ෂව රුපියලේ වටිනාකම ද ඊට සති කිහිපයකට පෙර තිබු රුපියල් 134 සිට 140-142 දක්වා වෙළදපොලේ පහල වැටීමය.
ජාත්‍යන්තර මුල්‍ය අරමුදලෙන් මෑතකදී ලංකාවට පැමිණි නියෝජිතයන් ද උපදෙස් දුන්නේ රුපියලේ වටිනාකම පහල වැටීමට හැරීමෙන් ආනයන භාණ්ඩ මිල වැඩි වී එම භාණ්ඩ සදහා වන ඉල්ලුම අඩු වී විදේශ මුදල් වියදම ද ඒ නිසා අඩු වන බවය. මෙය මුල්‍ය අරමුදලේ අප වැනි සෑම රටකටම දෙන කෝකටත් තෛලයකි.
ලංකාවේ ජීවන මට්ටම ඉහල යාමට හේතුවන, පුද්ගලික වාහන හිමි ජනගහනය ඉහල යාම ද මේ නිසා නැවත අඩු වනු ඇත. එමෙන්ම රජයේ ආනයන බදු ආදායම ද අඩු වනු ඇත. එකල්හි රජය එම අදායම් පියවා ගැනීම සදහා ජනතාව වෙත වෙනත් බදු පැනවීමට ක්‍රියා කරනු ඇත. ඒ සඳහා භාණ්ඩ ගණනාවකටම වැට් බදු, ආනයන බදු, ජාතිය ගොඩනැගීමේ බදු ඉහල දැමීමට රජය දැනටමත් ක්‍රියාකර ඇත. තවද අඩු ආදායම් මට්ටමෙන් ගැලවී යන්තම් හිස එසවීමට තැත් කල ජනකොටසට මේ නිසා පහර වැදුනි. එමෙන්ම වාහන ආනයන වෙලදාම අඩු වී ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය එපමණකින් දුර්වල වනු ඇත.
රුපියලේ වටිනාකම පහල වැටෙන විට අපගේ මුළු ආදායමෙන් අඩක් පමණ වන විදේශ ණය බර ගුණාකාරව ඉබේම වැඩිවන්නේය. මේ නිසා විදේශ ණය ගෙවීම් ද ඉහල යනු ඇත. තවද මීලඟ මාස 12 තුල ඩොලර් බිලයන තුනක ණය වාරික හා පොලී ගෙවිය යුතුය. අඩු ආදායම්ලාභි ජන කොටස් වලට තම පරිභෝජනය අඩු කිරීමට හෝ වැඩියෙන් ඉපයීමට සිදු වනු ඇත. වැටුප් ලබන්නන්ට හා සුළු රැකියා කරන්නන්ට තමන්ට උවමනා ලෙස ආදායම් වැඩි කර ගැනීම අපහසු නිසා නිත්‍ය වශයෙන් සිදුවන්නේ ඔවුන්ගේ අත්‍යවශ්‍ය පරිභෝජනය පවා අඩු කිරීමය.
කුකුල් මස් මිල වැඩිවනවාත් සමගම බිත්තර මිල ද වැඩි වී ඇති අතර අඩු ආදායම් ලාභීන්ට ප්‍රෝටීන් ලබා දෙන ප්‍රධාන ආහාරයන් වු පරිප්පු, මුං ඇට ආදියේ මිල ද වැඩි වීම නිසා ජනගහනයෙන් සියයට හතලිකට පමන ප්‍රෝටීන් ආහාර ළබා ගැනීමට නොහැකි වනු ඇත. මොවුන්හට දැනටමත් සාමාන්‍යයෙන් දිනකට පිරිමියෙකුට අවශ්‍ය 2500 ක කැලරි ප්‍රමාණය ලැබෙන්නේද නැත. මෙසේ සිදුවන්නේ ලෝක වෙළදපොලේ ආහාර මිල අඩුවෙමින් තිබියදීය.
වියදම් පැත්ත මෙසේ ඉහල යමින් තිබියදී රටේ දිස්ත්‍රික්ක ගණනාවක තේ රබර් කුරුදු ආර්ථිකයෙන්ම ජිවත්වූ සුළු ඉඩම් කට්ටිකරුවන් මුහුණ දී සිටින්නේ තේ හා රබර් වලට දුන් සහන මිල මැතිවරණයෙන් පසු රජය නවතා දැමීම නිසා උග්‍ර ජීවන අර්බුදයකටය. තවද රුපියලේ අගය අඩුවීම නිසා අනික් අතට තේ රබර් කුරුදු ආදි අපනයනයන්ට රුපියල්වලින් වැඩි මිලක් ලැබෙන බවක් දැන ගැන්මට ද නැත.
සැප්තැම්බර් අග ඉරිදා ටයිම්ස් පුවත්පත ආර්ථික විද්‍යාඥයන්ගෙන් දැනගත් තොරතුරු අනුව, රටේ මුළු ණය බර රුපියල් ට්‍රිලියන 8.2 කට පමණ වේගයෙන් ඉහල ගොස් ඇත. වාර්ෂික රාජ්‍ය ණය වාරික හා පොලී ගෙවීම් රජයේ මුළු ආදායම ඉක්මවා ඇත. වෙළද ශේෂයේ හිගය 2015 ප්‍රථම හය මස තුල සියයට 15.6 න් වැඩි වී ඇත. එහෙත් සැප්තැම්බරයේ පහළ වැටී ඇත.
ආර්ථිකයේ මේ සියළු දසමහා දෝෂයන් අවසාන වශයෙන් ජනතාවගේ කරපිටට වැටෙන්නේය. මේ නිසා සෘජුවම ජන ගහනයෙන් සියයට හතලිහක් පමණ වු ජනතාවගේ ජීවන තත්වයට බරපතල ලෙස පහර වදිනු ඇත.
පාත් ෆයින්ඩර නැමති ආර්ථික මොලකාරයන්ගේ සංවිධානය විවෘතවම වෙළඳපොල වාදීය. එමෙන්ම ආර්ථික මනා කළමනාකරණවාදීය. එනම් අයවැය තුලනය කිරීම මූලිකය. ඒ සඳහා අරපිරිමැසුම් ආර්ථික ප්‍රතිපත්ති දේශනා කරයි. එහි අර්ථය නම් පොදු ජනතාව වෙනුවෙන් කරන රාජ්‍ය වියදම් අඩු කිරීමය.
අගමැතිතුමා නැවත නැවතත් කියා ඇත්තේ පසුගිය ඉන්දීය ගමන විස්තීර්න ආර්ථික ගිවිසුම ගැන සැකච්ඡා කිරීම සඳහා නොවූ බවය. එහෙත් පාත් ෆයින්ඩර්වරුන් ඊට වඩා හොඳින් කරුණු දන්නා බව පෙනේ.
රනිල් මෝඩි හමුව එකී ආර්ථික ගිවිසුම් ගැන කරන සාකච්ඡාවට පසුතල වශයෙන් පාත් ෆයින්ඩර් මෙම ලිපි සකස්කර පුවත්පත් වල පළ කල බවය. එසේ නම් එවැනි සාකච්ඡාවක් න්‍යාය පත්‍රයේ

06 පිටුවට

## අධිරාජ්‍යවාදයේ වටලෑම ...

01 පිටුවෙන්

මාස කිහිපය තුල ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය සියයට අටකින් පමණ පහල ගොස් ඇති අතර පසුගිය ජනවාරි මස රුපියල් 132 ක් වු ඩොලරයක වටිනාකම මේ වනවිට රුපියල් 143 ක් දක්වා වැඩි වීමෙන් රුපියල් 10 කින් රුපියල බාල්දු කර ඇත. මේ නිසා අපගේ විදේශ ණය බර ඉහල යයි. මෙය රජය අනුගමනය කළ ඉතා හොඳ ප්‍රතිපත්තියක් බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිතයන් කියා සිටී.
මේ හේතු කොට ගෙන සියලු ආනයන භාණ්ඩ වල මිල ඉතා සීඝ්‍රයෙන් වැඩි වී ඇත. දැනටමත් අත්‍යවශ්‍ය භාණ්ඩවල හා වාහන ඇතුළු යන්ත්‍ර සූත්‍රවල මිල අධික ලෙස වැඩි වී ඇති අතර ඉදිරි කාලයේදී කෘෂි පොහොර හා රසායනික ද්‍රව්‍ය මිල ද වැඩි වනු ඇතැයි ආර්ථික විශේෂඥයන්ගේ මතය වී තිබේ. මීට අමතරව රජය භාණ්ඩ ගණනාවක ආනයන බදු වැට් බදු හා වෙනත් බදු වැඩි කිරීමටද ගත් පියවර නිසාද එකී භාණ්ඩ මිල තවත් වැඩිවනු නියතය. මෙම පියවර නිසා එකී භාණ්ඩ හා ද්‍රව්‍ය වලට ඇති ඉල්ලුම අඩු වී විදේශ මුදල් පීඩනය අඩුවීම ආර්ථික වශයෙන් යහපත් බව රජය කියයි.
එබැවින් රනිල් මෛත්‍රී ඊනියා ජාතික ආණ්ඩුව අනුගමනය කරන අධිරාජ්‍ය ගැති දේශපාලන සමාජ ආර්ථික ප්‍රතිපත්තිය කරන කොට ගෙන, ඉදිරියේදී ආණ්ඩුව ඇතුලත අභ්‍යන්තර ප්‍රතිවිරෝධයක් මෙන්ම පිටතින් මතු වන විරෝධයේ බලවේගයන් හේතුවෙන් ඉතා කෙටි කාලයක් තුළ යූ.එන්.පී. හවුල් ආණ්ඩුව අර්බුදයට ගමන් කරනු ඇතැයි දේශපාලන විචාරකයන්ගේ මතය වී තිබේ.



# ඇමරිකා - ශ්‍රී ලංකා ඒකාබද්ධ යෝජනාව
# ජාතික නිදහස, ස්වෛරීභාවය, ස්වාධිපත්‍යය වනසයි

## විපක්ෂ පෙරමුණ විරෝධතාවයකට සූදානම්



### ජනතාව ඒක්කරගෙන සටන් කළ යුතුයි.

**දිනේෂ් ගුණවර්ධන මැතිතුමා**
**පාර්ලිමේන්තු මන්ත්‍රී**
**නායක**
**මහජන එක්සත් පෙරමුණ**

30 අවුරුදු යුද්ධය නිමා කර මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය විසින් රට නිදහස් කර ගත්තා. එම අවස්ථාවේදී මිත්‍රශීලී රටවල් අපට ජාත්‍යන්තර වශයෙන් උදව් කලා. බෙදුම්වාදී බලවේග ශක්තිමත් කළ ඇතැම් රටවල් ශ්‍රී ලංකාව නිදහස් රටක් ලෙස සංවර්ධනය වෙමින් ලෝකයට එක්ව සිටිනවා දකින්න අකමැතයි.

යුද්ධ සමයේ ඇතිවුවායයි කියන සිද්ධීන් මුල්කර ජාත්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය බව කියමින් පසුගිය වසර ගණනාවක සිට මානව හිමිකම් කොමිසමට යෝජනා ගෙනවිත් සම්මත කලා. අපගේ රට නිදහස් කර ගත් රණවිරුවන් හෝ දේශපාලන නායකත්වය හෝ එවැනි ජාත්‍යන්තර පරීක්ෂණයකට යොමු කිරීමට එකඟ වෙන්න බැහැ. ඒ නිසා එම යෝජනා අප එදා ප්‍රතික්ෂේප කළා.
මෙවැනි දෙයක් ලෝකේ කොහෙවත් සිදුවෙලා නැහැ. සම්පූර්ණයෙන්ම එකපාර්ශවීය, පිලිගත නොහැකි බොරු චෝදනා මගින් රණවිරුවන් වැරදිකරුවන් කරන්න සූදානම්වීමක් මෙහි තිබෙන්නේ. ඒ නිසා මෙයට අප එකහෙලාම විරුද්ධයි. ජනතාව ඒකරාශී කර ගෙන සටන් කළ යුතුයි. යටත් නොවිය යුතුයි.

### අධිරාජ්‍යවාදී යුධ කඳවුරක තර්ජනයක්

**මහාචාර්ය තිස්ස විතාරන මැතිතුමා**
**ප්‍රධාන ලේකම්**
**ලංකා සමසමාජ පක්ෂය**

1935 සිට අධිරාජ්‍යවාදයට විරුද්ධව සටන් කිරීමේ උරුමය අප පක්ෂයට තිබෙනවා. එදා අපගේ නායකයින් හිරබත් කමින්, රටින් පැනයමින්, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව සටන් කරමින් පූර්ණ නිදහස දිනාගන්න කටයුතු කලා. එදා සූරියමල් ව්‍යාපාරය ලෙස අධිරාජ්‍ය විරෝධී අරගලය දියත් කලා. වර්තමානයේ ඇතිවී තිබෙන තත්ත්වය අනුව එම සටන ඉදිරියටත් ගෙනයාමට අපට සිදු වෙලා තිබෙනවා.
සමසමාජ-කොමියුනිස්ට් ව්‍යාපාරයේ වාමාංශිකයින් එක්වී පූර්ණ නිදහස දිනා ගැනීමේ අරගලයේ එක් පියවරක් හැටියට තමයි 1948 නිදහස ලැබුනේ. එය සීමිත නිදහසක්. 1956 වෙනකම් බ්‍රිතාන්‍ය යුද්ධ කඳවුරු අප රටේ තිබුනා. බණ්ඩාරනායක මැතිතුමාගේ රජය එය ඉවත් කලා. එහෙත් පූර්ණ නිදහස දිනාගන්න හැකිවුනේ 1972 ව්‍යවස්ථාවෙන්. එම ව්‍යවස්ථාව සම්පාදනයට විශාල වැඩකොටසක් කලේ අප පක්ෂයේ නායකයෙක් වූ ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා සහෝදරයායි.
ඇමරිකා- ශ්‍රී ලංකා ඒකාබද්ධ යෝජනාව පැහැදිලිව අධිරාජ්‍යවාදීන්ගේ යුද්ධ කඳවුරක් අප රටතුල ඇති කර ගැනීමට ගන්නා උත්සාහයක්. එය ඔවුන්ගේ පැසිපික් කලාපීය හමුදා ප්‍රධානියා ප්‍රකාශ කර තිබුනා. ලංකාවට විරුද්ධ බටහිර බෙදුම්වාදී සංවිධාන සම්පූර්ණයෙන් ගොතන ලද හා විකෘති කරන ලද වාර්තා හා චැනල් 4 වැනි සිනමා පට ජාත්‍යන්තර තාක්ෂණික විද්වතුන් විසින් ඛන්ඩනය කර බලා ඒවා නිර්මානයන් ලෙස සැකසූ දර්ශන බව හෙලිකර ගෙන තිබෙනවා. ලේ වෙනුවෙට වෙනත් ද්‍රව්‍ය යොදා ගත් බවටත් ඔප්පු කර පෙන්නා දී තිබෙනවා. මෙවැනි බොරු චෝදනාවලින් හමුදාව දුර්වල කරන්නයි ඔවුන් උත්සාහ කරන්නේ. එයට අප ඉඩදිය යුතු නැත.

### පාවාදෙන රාජ්‍ය නායකයින් රැලක් එකට එකතු වෙලා.

**පොඩිඅප්පුහාමි මැතිතුමා,**
**සභාපති.**
**දේශවිමුක්ති ජනතා පක්ෂය**

1947දී රැජින ලනුව අතේ තියාගෙන අපට බලය දුන්නේ. එම බලය අප ගත්තේ 1972 සිරිමා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව කාලයේදීයි. එදා තෙල් ජනසතුවේදී ඇමරිකාව විරුද්ධ වුනා. පී.එල්. 480 පිටි සහනාධාරය නැවැත්තුවා. එවා කිසිවකටත් අපගේ රාජ්‍ය නායකයින් බිය වුනේ නැහැ. අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව එඩිතර තීරණ ගත්තා.
අද වෙලා තියෙන්නේ ඒකේ අනිත් පැත්ත පාවාදෙන රාජ්‍ය නායකයින් රැලක් එකට එකතු වෙලා. 1947 තිබුණ තත්ත්වයටත් එහායින් රට තබන්නයි ඔවුන් බලන්නේ. වාමාංශිකයින් ලෙස පෙනී සිටින ජේ.වී.පී. යද ඇමරිකන් කඳවුරේ ඔත්තුකරුවන් බවට පත්වෙලා. එනිසා විපක්ෂ බලවේගය පොදු ජනතාවත් සමඟ පෙරට යන වැඩපිලිවෙලක් සකස් කර ගැනීම අවශ්‍යයි.

### නිදහස් සන්ධාන විපක්ෂ මන්ත්‍රීවරු විරුද්ධයි.

**බන්ධුල ගුණවර්ධන මැතිතුමා**
**පාර්ලිමේන්තු මන්ත්‍රී හා**
**ශ්‍රී ල.නි.ප. විපක්ෂ නියෝජිත**

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජනතාවගේ නිදහස, ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් හැමදා පෙනී සිටි දිවි හිමියෙන් සටන් කළ පක්ෂයක්. එනිසා වර්තමාන විදේශ අමාත්‍යවරයා හා අග්‍රාමාත්‍යවරයා විසින් ඇමරිකාව සමඟ ඒකාබද්ධව ශ්‍රී ලංකාවට එරෙහිව ගෙනඒමට සූදානම් වන යෝජනාවට අප පක්ෂයේ සියලුදෙනාගේම අනුමැතියක් නැත. මේ පිලිබඳව අපගේ නායක හා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් කරුනු සොයා බැලීමට කමිටුවක් පත්කර තිබේ. එහිදී මේ පිලිබඳව තීරණය කරනු ඇත. එම කමිටුවේ සාමාජිකයෙකු ලෙස මවිසින් මෙම යෝජනාවේ ඇති බරපතලකම හා රටට සිදුවන අවාසිය හානිය සඳහන් කර පක්ෂයේ එකඟත්වය නොදිය යුතු බව දන්වා යවා තිබෙනවා. 1815 කන්ද උඩරට ගිවිසුමෙන් අප යටත් කර පරාධීන තත්ත්වයට පත් කළත් 1915 අධිරාජ්‍යවාදීන් බෙදා පාලනය කිරීමේ උපක්‍රමය නිසා සිංහල - මුස්ලිම් කෝලාහලය ඇති වුනා. එහිදී අධිරාජ්‍යවාදීන් ජාතික වීරයන් ලෙස එෆ්.ආර්.සේනානායක, පියදාස සිරිසේන, අනගාරික ධර්මපාල ආදීන් 1915දී සිරභාරයට ගෙන දඬුවම් කලා. ඊට හරියටම අවුරුදු 100කට පසුව 2015දී අපගේ ජීවමාන නායකයා වූත්, ත්‍රස්තවාදී යුද්ධය ජයගත් නායකයා වූත් මහින්ද රාජපක්ෂ මැතිතුමා, ආරක්ෂක ලේකම් හා රණවිරුවන් පාවාදීම සඳහා මෙම ගිවිසුම ගෙන එන බව අපට පැහැදිලිය. එදා අපට මුහුදෙන් 2/3ක්ද, ගොඩබිමින් 1/3ක්ද අහිමි විය. එම තත්ත්වය වෙනස් කර අප සැමට නිදහසේ ජීවත්වීමට හැකි ලෙස දේශය නිදහස් කර ගෙන 2009 සිට 2014 දෙසැම්බර් දක්වා කිසිදු ත්‍රස්තවාදී ක්‍රියාවකට ඉඩක් නොදී රට පාලනය කෙරුනා.
සමූහ ඝාතන, යුද්ධ අපරාධ ගැන බොරු චෝදනා අධිරාජ්‍යවාදීන් විසින් නගනවා. එම තත්ත්වයට මුහුණදීමට රජය සූදානම් විය යුතුයි. වර්තමාන ආණ්ඩුව කොන්ද කඩා ගෙන කරන පාවාදීම ගැන විරුද්ධ පක්ෂයේ සිටින ශ්‍රී ල.නි.ප. පාර්ලිමේන්තු මන්ත්‍රීන් ලෙස අපගේ එකඟත්වයක් නැත.

### පාර්ලිමේන්තුවේ 2/3 ඡන්දයක් හා ජනමත විචාරනයක් අවශ්‍යයි

**විමල් වීරවංශ මැතිතුමා**
**පාර්ලිමේන්තු මන්ත්‍රී**
**නායක**
**ජාතික නිදහස් පෙරමුණ**

අග්‍රාමාත්‍යවරයා දබර ඇඟිල්ල ජනමාධ්‍ය වෙත යොමු කරමින් තිබේ. ඇත්ත තත්ත්වය ජනතාවට හෙලිදරව් වුවහොත් සිදුවිය හැකි තත්ත්වය ගැන ඔහුට දැනෙන්නට පටන් ගෙන තිබේ. ඒ නිසා අග්‍රාමාත්‍යවරයාගේ දබර ඇඟිල්ලට බිය නොවී මේ රට, ජාතික, නිදහස ගැන කැක්කුමක් තිබෙන මාධ්‍යවේදී සහෝදරවරුන් හැකි සෑම ආකාරයකින්ම මෙම අදහස් ජනතාව අතරට ගෙන යන ලෙස ඉල්ලා සිටිනවා.
දැන් රනිල් මහතා කියනවා දෙමුහුන් කියන වචනය ඉවත් කලා කියලා. හොඳින් අධ්‍යයනය කලොත් දෙමුහුන් වචනය නොමැති වුනාට විදේශ විනිසුරුවන් ඇතුලත් කර නඩු ඇසීමට සූදානමක් තිබෙනවා. විදේශ අභිචෝදනාකරුවන්, නීතිඥයින් ගෙන්නා ගැනීම මෙම ගිවිසුමේ තිබෙනවා. ඒ නිසා වචනය හංගා දේශයේ නිදහස පාවාදීමට ප්‍රායෝගික උපක්‍රම ගෙන එන්න ඉඩ නොතැබිය යුතුයි. ලෝකයේ මොන රටේද නීත්‍යානුකූල හමුදාවට විරුද්ධව විදේශිකයෝ ගෙන්නලා පරීක්ෂණ කරන්නේ. හමුදාවේ වැරදි වුවහොත් ඒ ගැන කටයුතු කරන්න ඕනෑ අභ්‍යන්තර අධිකරණය මගින් පමණයි.
ආණ්ඩුව හදන්නේ ඔවුන්ට බලය අරන් දුන්න හාම්පුතුන්ට දෙන වරදානයක් ලෙස ආරක්ෂක හමුදාව පාවාදෙන්නයි. රටේ නීත්‍යානුකූල හමුදාව එම හමුදාවට නායකත්වය දුන් ජනාධිපති මහින්ද රාජපක්ෂ, ආරක්ෂක ලේකම්, හමුදාපති ඇතුළු බ්‍රිගේඩියර්වරු 20 දෙනෙකුගේ ලැයිස්තුවක් මොවුන් ලඟ සකස් කරල තියෙනවා. මොවුන්ට ගෙන එන්නේ යුද්ධ අපරාධ චෝදනායි. හිටපු තනතුරු හා සේවයෙන් ඉවත් කිරීමට යෝජනාවී තිබෙනවා. ඒ නිසා මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට පෙර පාර්ලිමේන්තුවේ 2/3 ඡන්දයෙන් සම්මත කර ගෙන ජනමත විචාරනයකට ගෙන යා යුතුයි. ඒ සඳහා වන අධිකරණ ක්‍රියාදාමයට අප සූදානමින් සිටිනවා.

### පක්ෂ පාට නොතකා පාවාදෙන යෝජනාවට විරුද්ධ වෙමු

**උදය ගම්මන්පිල මැතිතුමා**
**පාර්ලිමේන්තු මන්ත්‍රී**
**නායක**
**පිවිතුරු හෙළ උරුමය.**

මෙම ගිවිසුම මගින් හෙට උපදින දරුවාගේ ඉරනම පවා පාවාදීමකට ගෙනයාමට සූදානම් කර තිබේ. එදා අප යටත් වූයේ එංගලන්තයේ රැජිනිටයි. අද අධිරාජ්‍යවාදී බලකඳවුරකට අප රට යටත් කර ගැනීමට නියමිතයි.
ඒ නිසා අප සැවොම පක්ෂ පාට බේදයක් නොතකා මෙම පාවාදෙන ගිවිසුමට විරුද්ධ විය යුතුය. අප රටේ ව්‍යවස්ථාවේ පැහැදිලිව දක්වා ඇත්තේ වෙනත් කිසිම රටකට අපගේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් විය නොහැකි බවයි.
මොවුන් කියන්නේ මෙම ගිවිසුම මහින්ද මහතා ජාත්‍යන්තරය සමඟ එකඟතාවය අනුව සිදුවන බවයි. මෙය අමූලික මුසාවකි. එවැන්නක් ඇත්නම් වහාම ඉදිරිපත් කරන ලෙස අපි අභියෝග කරමු. අනෙක මහින්ද මහතා විසින්ද විදේශිකයින් කොමිෂන්වලට කැඳවූ බව කියයි. නමුත් එතුමා විදේශ විශේෂඥයින් යොදා ගත්තේ උපදේශක මට්ටමින්ය. ඔවුන් දෙන උපදෙස් පිලිගැනීමට හෝ නොගැනීමට ස්වාධීන බලයක් අපගේ කොමසාරිස්වරුන් සතුයි.
මවුබිමේ නිදහස ස්වාධිපත්‍ය අනතුරට පත්වූ සැම මොහොතකම ඉතිහාසය පුරා අපගේ මුතුන් මිත්තන් අරගලය කර ඇත. ඒ අකාරයෙන් මෙවරත් අපට ඉතිරිව ඇත්තේ නිදහස ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අධිරාජ්‍යවාදීන්ට එරෙහිව සටන් කිරීම පමනයි.

### ඇමරිකාව ලංකාවට දක්වන ආදරය සතෙකු උගේ ගොදුරට දක්වන ආදරය වැනිය

**වාසුදේව නානායක්කාර මැතිතුමා**
**පාර්ලිමේන්තු මන්ත්‍රී**
**ලේකම්**
**ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ**

1815 උඩරට ගිවිසුමෙන් ලංකාව යටත් කරගත් ආකාරයටත් වඩා දැඩි ලෙස ඇමරිකානු-ශ්‍රී ලංකා ඒකාබද්ධ යෝජනාවෙන් රටටත් ජනතාවටත් මහා විනාශයක් ඇති විය හැකිය. 1815 ගිවිසුමේ ජනතාවගේ ක්‍රියාකාරීවීමේ ඉඩකඩක් සහිත කොන්දේසි තිබුණි. වර්තමාන ගිවිසුමෙන් කිසිදු ඉඩකඩක් නොතබා නිදහස පාවාදීමට සැරසේ.
මෙම යෝජනාව සම දායකත්වයෙන් ඉදිරිපත් කරන බව රටට පෙන්නුවත් ඇත්තවශයෙන්ම සිදුව ඇත්තේ ඇමරිකාවේ උවමනාවට ශ්‍රී ලංකාව යටත් කර හීලෑ කර දීමයි. ඇමරිකාව යම් තැනකට අත ගැසුවොත් එය ඔවුන් කුමන ආකාරයෙන්වත් අත් නොහරින බව ඉරණවිල ඇමරිකන් හඬ විකාශනාගාරය පිලිබඳ ගිවිසුම අවලංගු කිරීමට ගත් උත්සාහයේදී පෙනී ගියා. ඇමරිකාව ලංකාව ගැන දක්වන ආදරය සතෙකු තම ගොදුරට දක්වන ආදරය වැනිය.
නීතියේ ආධිපත්‍ය ගැන වර්තමාන රජය කථා කලත් සිදුවන්නේ ඇමරිකානු ආධිපත්‍යයට යටත්ව කටයුතු කිරීමට සිදුවීමයි. ජිනිවාහි ලංකා තානාපති මෙම ඒකාබද්ධ යෝජනාව පිලිබඳව අනතුරු ඇඟවීම් සිදු කර ඇතත් ඒ කිසිවකට කන්දීමට වර්තමාන පාලකයින් උනන්දු නොවීම රටේ අභාග්‍යයකි.
අපගේ උගත් පාඩම් කොමිෂමේ වාර්තාව ඉතාම වැදගත් ලියවිල්ලක් ලෙස ජාත්‍යන්තරයද පිලිගෙන තිබේ. එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම පසුගිය රජය කාලයේදී පමා වුනා. ඇත්තවශයෙන්ම වර්තමාන රජය ක්‍රියා කළ යුතු වන්නේ එම වාර්තාවේ නිර්දේශ පූර්ණ වශයෙන් ක්‍රියාවට නැඟීමයි. එය නොකර වර්තමාන රජය ජාතික නිදහස, ස්වාධිපත්‍ය, ස්වෛරීභාවය විනාශ වන මේ අපරාධය සමාව දිය නොහැකි ආකාරයේ පාවාදීමකි.

### ඒකපාර්ශවික ජාත්‍යන්තර පරීක්ෂණයක්

**රාජා කොල්ලුරේ මැතිතුමා**
**සභාපති**
**ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය**

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය ලෙස ඇමරිකාව සමඟ එක්වී අත්සන් කිරීමට සූදානම් වන යෝජනාවට මුළුමනින්ම විරුද්ධත්වය ප්‍රකාශ කරමු. අප ක්‍රියාකල යුතු වන්නේ අප රටේ ස්වාධිපත්‍ය, ජාතික නිදහස ආරක්ෂා වෙන ආකාරයෙන්ය.
උගත් පාඩම් කොමිෂමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම පමා වූ නිසා මෙම තත්ත්වය උදාවී තිබේ. එසේ වුවත් ක්‍රියාත්මක විය යුතුව තිබුනේ පසුගිය රජයට කළ නොහැකි දේ වර්තමාන රජය මගින් කඩිනමින් ඉටු කිරීමයි.
එය සිදු නොකර යෝජිත දේශීය යාන්ත්‍රනය හෝ දෙමුහුන් යාන්ත්‍රණය පිලිබඳ කථාව මුලාවකි. මෙම ගිවිසුම අනුව විදේශික විනිසුරුවන්, උපදේශකයින්, නීතිඥයින් ගෙන්නා සිදුකරන විභාගයක් වන බැවින් එය එක්තරා ආකාරයක ඒකපාර්ශවික ජාත්‍යන්තර පරීක්ෂණයක් වනු ඇත. එම යෝජනාවට එකඟවීමෙන් සිදුවන්නේ ශ්‍රී ලංකා හමුදාව විසින් යුද්ධයේ අවසාන භාගයේදී මිනී මැරීම්, ස්ත්‍රී දුෂණ, ලිංගික අපචාර, පැහැරගැනීම් හා අතුරුදහන් කිරීම් ආදී අකටයුතුකම් සිදු කළ බව පිලිගැනීමයි. එනිසා මෙම විනිශ්චයන්හිදී කෙසේ සාධාරණයක් ඉටුවේදැයි යන ප්‍රශ්ණය නිතැතින් මතුවේ.

# ජාතික නිදහස, ස්වාධීපත්‍ය වනසන ඇමරිකානු-



# පොදු ජන විරෝධය



එක දිගට සැප්තැම්බර් අග සිට කඩින්කඩ ඇදහැලෙන ඊසානදිග අන්තර් මෝසම් වර්ෂාව දිවයිනේ තෙත්කලාපය තෙතබරිත කර තිබේ. කළුකරයේ නායායාම් සිදුවී ජීවිත - දේපොල අනතුරු සිදුවිය. දකුණේ දරුණු නොවුනත් ගංවතුර තත්ත්වයකි. දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉමදූව-කොක්මාදූව අතර කොටස වසාදැමීම හේතුවී ඇත්තේ ගිලාබැසීම් හා කළුකඩාවැටීමය. තවමත් උතුරු නැගෙනහිර හා වියලි කලාපයට වර්ෂාවේ පහස නොලැබීමෙන් ජනතාව පීඩාවක සිටී. කාලගුණික වෙනස්වීම්වලට යම් තරමක් අනුරූපික දේශපාලන බිමේද කැළඹීම් සිදුවෙමින් තිබේ. එක දිගටම වර්තමාන ආණ්ඩුව පත්වූ දා සිට කඩින් කඩ ඇද හැලෙන වර්ෂාව මෙන් ජනතාවට ජීවන වියදම් බර පැටවීම සිදු විය. ඇමරිකානු මානව හිමිකම් යෝජනා ක්‍රියාත්මක කිරීමට ලංකාව එකගවීමත් සමග පොදු ජනතාව වික්ෂිප්තව සිටිති. ජාතික නිදහස, ස්වාධීපත්‍ය, පරමාධිපත්‍ය රැක ගැනීමට ඉදිරියේදී ක්‍රියා කරන ආකාරය ආණ්ඩු විරෝධීන් අතර සාකච්ඡා කරමින් තිබේ.

## ජාතික ආණ්ඩුවෙන් බත්පතට වැලි

ප)ජාතික ආණ්ඩුවේ පලමු ප්‍රහාරය වී ගොවියන්ගේ යටිබඩ හරහා එල්ල වී තිබේ. සීමිත 'වී' ප්‍රමාණයක් ආණ්ඩුව මිලදී ගෙන වෙළඳ පොලේ වී මිල යම් මට්ටමක රඳවා ගැනීම එහි අරමුණ විය. මෙවර රජය හොර ගල් අහුලමින් වී මිලදී ගැනීමේ වගකීම පැහැර හැර වී ගොවියා වෙළඳ පොල ගිණිමැලයට තල්ලු කර තිබේ. මහින්ද රජය ගෙන ගිය වෙළඳපොලට මැදිහත්වීමේ ප්‍රතිපත්තියෙන් ආණ්ඩුව බැහැර වූයේ ලෝක මූල්‍ය බලවතුන්ගේ අවධානය දිනා ගෙන බටහිර ණය මාර්ග පාදාගැනීමට යෙදූ උපායික පියවරක් වන නිසාය. රජය වී මිලදී ගැනීම අවම කර වෙළඳ පොල යාන්ත්‍රණයට ගොවිතැන හසුකර සුළු ගොවියා ඉඩමෙන් බැහැර කිරීම ආණ්ඩුවේ සැලසුමයි. මෙම පිලිවෙතින් සුළු ගොවියා නැති බංග වන අතර මෝල් හිමියන් හා එමගින් ධනවතුන් බවට පත්වූ දේශපාලඥයින් ගොවිතැන කොම්පැනිවලට පවරා ගනිමින් නාගරික නව ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ වීරයන් බවට පත් වේ. ගොවි ජනතාව දැනගත යුතු කාරණය වන්නේ (ප)ජාතික රජය වී අස්වැන්න මිලදී ගැනීම අත් හැරීම පමණක් නොව ඉදිරියේදී පොහොර සහනාධාරය කපා දමා අස්වැන්න අඩු කිරීම, ගොවිතැන අත්හැරෙන විට ඉඩම් වෙළඳ පොලට යොමු කරවීම, කොම්පැනි වලින් කුඩා ඉඩම් මිලදී ගෙන විශාල ගොවිබිම් යායවල් තැනීම, නව යාන්ත්‍රික හා තාක්ෂණික ක්‍රම යොදමින් කොම්පැනිවලට ලාභ උපයන වගාවන් බවට ගොවිතැන පත් කර ගැනීම, ජලය, පරිසර වටපිටාව බහුජාතික සමාගම්වල උවමනාවට නතු කර ගැනීම හා ගොවි ජනතාව ගම් තුල කොටු කර කුලී කම්කරුවන් පිරිසක් බවට ක්‍රමයෙන් පරිවර්තනය වීමට ඉඩ හැරීම අධිරාජ්‍යවාදීන්ගේ වෙළඳපොල සැලැස්මයි.

## සිහි විකල්කර පොකැට්ටුවට විදීම

දැනට වී ගොවිතැනට කෙලින්ම එල්ල වී තිබෙන අභියෝගය ක්‍රමානුකූලව අනෙකුත් බෝග වගාවන්ට පමණක් නොව අපනයන කෘෂිකාර්මික වගාවටද ගමන් කරනු ඇත. තේ, රබර්, සුළු අපනයන බෝග ආදී වගාවන්ට පමණක් නොව එලවලු වගාවටද පොහොර සහනාධාරය, මිල සහනාධාරය ඉවත් කළ පසුව පාලුවන ඉඩම් අඩු මුදලට කොම්පැනි විසින් අල්ලා ගැනීම සිදුවේ. මෙයට අවශ්‍ය සමාජ දේශපාලන රාමුව ඇමරිකාවේ සිට අප රට පාලකයින්ගේ හිස්-කඳ මතින් ලක්බිමට ගිවිසුම්ගත කර ගෙන එමින් තිබේ. එය නව ලිබරල් ආර්ථිකවාදය, ප්‍රජාතන්ත්‍රවාදය සමග ගලපා ජාතික ජාත්‍යන්තර වෙළඳපොල ජාලයට නව තාක්ෂණය ඔස්සේ එක් කරනු ඇත. ජන ජීවිත පවත්වා ගෙන යාමේ ජනතාවාදී ප්‍රතිපත්තිය වෙනස්කර සමාජය වඩ වඩා වැඩියෙන් වෙළඳපොලට යොමු කරන අතර, මුදල් ජාවාරම උපයෝගී කරගෙන ලාභ උපයා ගැනීමට ප්‍රචාරක යාන්ත්‍රණය බලවත් කරයි. පොදු ජනතාවගේ අවශ්‍යතාවයන් හා ජාතික, ආගමික, සංස්කෘතික ඇගයීම් බිඳ දමයි. මුද්‍රිත මාධ්‍ය ඉක්මවා විද්‍යුත් මාධ්‍ය හා සමාජ ප්‍රචාරක ජාල බලවත්වී ඇති බැවින් ඒ සියල්ල නව ලිබරල් යාන්ත්‍රණයේ උපකරණ ලෙස ක්‍රියාත්මක වේ. වෙළඳ දැන්වීම් ප්‍රවෘත්ති බවට පරිවර්තනය කරමින් පාරිභෝගික ජනතාවගේ හිස් විකල්කර පොකැට්ටුවට විදීමේ කලාවට ජන මාධ්‍යකරුවා පුහුණු කර යොදවමින් තිබේ. ඔහු දක්ෂයෙකු බවට පත් වන්නේ ජනතාවගේ අන්තිම සතය දක්වා හුරා පොකැට්ටුවෙන් ඇද සමාගම්වලට එකතු කරදීමට සමත්නම් පමණය.

## වෙළඳපොල, ළමා අයිතිය, ආරක්ෂාව

බොහෝ දෙනා ළමා අයිතිය, ආරක්ෂාව, ළමුන්ට වෙන අතරවර ගැන මේ දිනවල මහ ඉහලින් කථා කරති. නමුත් බොහෝ දෙනෙකුට නොපෙනෙන කාරණය වී ඇත්තේ ළමා ලෝකය වැඩිහිටියන් විසින් අත්පත් කර ගෙන තිබීමයි. පාලන ක්‍රමය විසින් දෙමාපියන්, වැඩිහිටියන් වෙළඳ පොල තුල ගසාගෙන යන පරඬැලුන් බවට පත්කර මෙහෙයවයි. ළමුන් පමණක් එම ප්‍රවාහයෙන් ඉවත් කර තබන්නේ කෙසේද? ළමුන්ගේ අයිතිය, ළමා ලෝකය වෙලඳ පොල තුල අලෙවි කරන භාණ්ඩයක් බවට දෙමාපියන් විසින්ම පරිවර්තනය කර ගනියි. දක්ෂකම් එලි දැක්වීම, අධ්‍යාපනය, හොඳ පාසැල් තේරීම, උගතෙකු කිරීම, ආදී හැම දෙයක් ඇතුලතම ළමයාට ඔහුගේ අනාගතය ඔහුගේ ලෝකය අහිමි කිරීමේ වැඩිහිටි වෙළඳපොල අපේක්ෂාව මුල්කර ගනියි. එහිම අතුරුඵලය ලෙස අපචාර, දූෂිත ක්‍රියා සිදු වෙමින් තිබේ. පොලිසිය, නීති හා උසාවි ක්‍රියාත්මක වන්නේද එම රාමුව තුලය. වැරදිකරුවන් නිදැල්ලේ හැසිරෙන අතර, නිවැරදිකරුවන් කූඩු කර තලා පෙලා ඔවුන්ගේ ආත්මයද විනාශකර දමන සමාජ පරිසරයක් නිර්මානය කරමින් තිබේ.

## බලය විසින් නීතිය හැසිරවීම

රාජ්‍ය දේපොල අයුතු පාවිච්චිය ගැන ඝෝෂාව දේශපාලන බල ව්‍යාපෘතියේ ප්‍රචාරක අවියක් පමණකි. එයින් ඉදිරියට ක්‍රියාත්මක වන ආකාරයක් නැත. ජේ.ආර්. විසින් ඇතිකල ජනාධිපති ක්‍රමය, දිස්ත්‍රික් අනුපාත ඡන්ද ක්‍රමය හා ලිබරල් ආර්ථික රාමුවේ ආවේශයක් බවට පත්ව තිබේ. නීතිරීති ක්‍රියාත්මක කෙරෙන්නේද එම සීමාව තුලය. මෙහි හොඳම උදාහරණය සපයන්නේ හිටපු ජනාධිපතිවරියක වූ චන්ද්‍රිකා මහත්මියට විරුද්ධ ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් තීන්දුව දශකයකට ආසන්න කාලයක සිට තවමත් ක්‍රියාත්මක නොකිරීමය. එම තීන්දුව ක්‍රියාවට නගන ලෙස වාසුදේව හා විමල් වීරවංශ යන මන්ත්‍රීවරුන් දෙපල, අල්ලස් කොමිෂමට හා අපරාධ විමර්ෂණ අංශයට පැමිණිලි කලත් ඒවාද නිහඬය. මේ පිලිබඳව පොලිස්පති තුමා ගෙන් වාසුදේව මන්ත්‍රීතුමා විමසා ලිපි යවා ඇතත් ඔහුද නිසොල්මන්ය. මෙයින් පෙන්නුම් කරන්නේ නිතියට බලයක් නොමැති බවත්, බලය විසින් නීතිය හසුරුවන ආකාරයත්ය.

## නීතිය වල්වදී කැකිල්ලේ රජුගේ උසාවි ක්‍රියාත්මකයි

පසුගිය ජනාධිපතිවරයාගේ ඡන්ද ප්‍රචාරක වැඩකටයුතු සඳහා ස්වාධීන රූපවාහිනී අයාතනයට විශාල මුදලක් ගෙවිය යුතු බවට චෝදනා නැගේ. එම මුදල් වගකිව යුතු අයගෙන් අයකර ගත යුතුව ඇත. එසේ නොමැති වුවහොත් රාජ්‍ය ආයතනයක් වූ එම රූපවාහිනී සේවය බංකොලොත් තත්ත්වයට පත්වේ. වගකිව යුත්තන් අතහැර නීතිය වල්පාරේ ගමන් කරන බව පෙනේ. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ප්‍රචාරක වැය භාර ගත යුතු වන්නේ එම පක්ෂයේ වර්තමාන සභාපති වන ජනාධිපතිය. වැඩබලන ලේකම් පත්කල මන්ත්‍රීවරයෙකි. ඔවුන් එම තනතුරු ලබා ගෙන බිල් නොගෙවා පක්ෂ වගකීම එක් එක් අයට පැවරීම පුදුම සහගතය. ඔවුන්ට තනතුරු අවශ්‍ය වී ඇත්තේ ජාතික ලැයිස්තුව කොල්ලකෑමට හා එමගින් තමන්ගේ ආමාත්‍ය මණ්ඩලය සකස් කිරීමට පමණද යන්න ජනතාවට නගන ප්‍රශ්ණයයි. එනිසා කටඋත්තර ගත යුතු වන්නේ හිටපු ජනාධිපතිගෙන් නොව දැනට සිටින එම පක්ෂයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන නිලතල දරණ අයගෙනි. ඔවුන් එම වගකීමෙන් බැහැර කිරීම සිහිපත් කරවන්නේ බලය නීතිය වීමේ කැකිල්ලේ රජුගේ උසාවි ක්‍රමය ක්‍රියාත්මක කිරීමකි.

## ජනතලයේ කැකැරෙන

ඇමරිකා-ශ්‍රී ලංකා මානව හිමිකම් යෝජන
රනිල් - මංගල විරෝධය ජනතලයේ කැකැ
පත්වෙමින් තිබේ. පක්ෂ විපක්ෂ සියලුම
ජනතාවගේ බලපෑම තදින් එල්ල වෙම
පාර්ලිමේන්තුවත් ජනතා සටනත් එකට වෙලෙන
ගනිමින් තිබේ. නොසිතූ මොහාතක විප
පාර්ලිමේන්තුවෙන් එලියට බැස විරෝධය පෑ
අභයාරාම විහාරයට රැස්වූ ඒකාබද්ධ විපක්ෂ
මැදිහත්වීමට විරුද්ධව පුවත්පත් සාකච්ඡාවක්
කරුණු කියා පෑමත් පෙන්නුම් කරන්නේ පෙ
විරෝධය පාර්ලිමේන්තුවෙන් පිටතට ඇදෙන බව

## ජනතා පරමාධිපත
## බලය ආරක්ෂා කර

මැතිවරණ කොමසාරිස්ට දේශපාලනයේ
වෙනස්කම් රැසක් කල්වේලා ඇතිව පෙනෙ
තිබේ. මහත් උත්කර්ෂවත් අයුරින් දෙපාර්තමේ
සංවත්සරය දෙස් විදෙස් නියෝජිතයින්ද, පි
පක්ෂ නායකයින්ද, මැතිවරණ නිරීක්ෂක සං
ගෙන මනා ලෙස සංවිධානය කර තිබුණි. වි
පැවතුනත් ප්‍රජාතන්ත්‍රවාදය හා ඡන්ද ක්‍රමය
වෙනස් කිරීමට හැකි ජනතා පරමාධිපත්‍ය බලය
බව මැතිවරණ කොමසාරිස්වරයා 60 වසරක ඉ
දක්වමින් කළ කථාවෙන් පැහැදිලිවේ.

තමන්ගේ හෘද සාක්ෂියට අනුව රාජ්‍ය නි
ජනතාවගේ පරමාධිපත්‍ය බලය ආරක්ෂා කර,
එඟත්වයෙන් ඡන්ද පවත්වා ප්‍රතිඵල නිකුත්කර
රට පාලනය සඳහා අවස්ථාව ලබාදුන් ආකාර
ඔහු පමණක් නොව ඔහුට පෙර සිටි කොමසාරි
පැමිණෙන කොමසාරිස්වරයාගේද වගකීම වි
බේදයකින් තොරව අවස්ථානුකූලව පිය
දේශපාලනඥයින්ට අවවාදාත්මකව කරුණු කි
විය. මැතිවරණ කොමසාරිස්වරයා උත්සවය ස
ප්‍රථම දේශපාලන පක්ෂයේ වර්තමාන නායකයා
විතාරණ මැතිතුමාගේ සිට වර්තමාන සැබෑ විප
දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා දක්වාත්, ජීවතුන්
ජනාධිපතිවරිය වූ චන්ද්‍රිකා හා අනෙක් ජනාධිප
තම දෙපස හිඳුවා ගෙන හිටපු සන්ධාන බල
තත්ත්වයද නැති බැසිල් මහතා වැනි අයෙකු ප
ප්‍රදර්ශනය කලේ වෙනස්කම් පැවතුනත් ප්‍රජාත
කර ගැනීමට ජනතාවත් සමඟ දේශපාලන පක්
දෙනා එක්ව මුහුණ දිය යුතු බවයි. මෙයින් බැ
නිලධාරීන් ලෙස සිටිමින් දේශපාලනයට අවතීර
ගෝඨාභය වැනි මිලිටරි නියෝජිතයින් පමණි. ඒ
යුද්ධ නායකයින්ට ගරුකල හැකි ජනතා
නොමැති බව පෙන්නාදීමද විය හැකිය.

## විස

ජනාධිපති තුමාගේ කථාවෙන් එලිදැක් වූ
සංවර්ධන ජයග්‍රහන අත්පත් කර ගැනීමේ
ජාතික ආණ්ඩු යාන්ත්‍රණය නිසාම බිඳ වැටෙන්
හේතුව වන්නේ සංවර්ධන ඉලක්ක ජය ගැනීම
සාධකයක් වූ විසංවාදී ප්‍රජාතන්ත්‍රවාදී ඉඩක
වනසා දමා තිබීමය. ජනාධිපති නිල බලයේ
අධිකරනයත්, පාර්ලිමේන්තුවත්, විධායක
දැනටමත් ගෙන ඇති අවතීන්දු ලඟා කර
සංවර්ධන ප්‍රවේශයක් නොව ජනතා පිලිකුලකි.
නොපවත්වා නිලධාරී පාලනයක් මගින් ති
සංවර්ධනයක් ගැන කථා කිරීම නිව්යෝක් වල
ජනතාව එය දකින්නේ විලම්බීතයක් ලෙසිනි.

# කියුබානු විප්ලවයේ ජයග්‍රහණ තහවුරු කිරීමට ආසියානු ශාන්තිකර සහයෝගීතා සමුළුව සැරසේ

කලාපයේ රටවල් 18 ක් 200 කට වැඩි පිරිසක් ආසියා ශාන්තිකර කියුබානු සහයෝගීතා සමුළුව පැවැත්වූ, වියට්නාමයේ, හැනොයි නගරයට රැස්විය.

මෙහිදි සාධනය කර ගත්තේ කියුබාව දිගින් දිගට මුහුණ දෙන අධිරාජ්‍යවාදී අයුතු බලපෑම් වලින් මිදීම සඳහා කියුබානු ජනතාව දරණ පරිශ්‍රමය බලවත් කිරීමට ලෝක ජනතාව ගේ සහයෝගිතාවය පල කිරීමය.

කියුබානු විප්ලවයේ සිට මෙතෙක් පැමිණි 50 වසරකට වැඩි ගමන් කාලය තුල ඇති කර ගෙන තිබෙන සමාජ, සංස්කෘතික, ආර්ථික පරිවතනය සැමටම ආස්වාදයක් හා ප්‍රබෝධයක් ඇති කර තිබේ. එමෙන්ම ඔවුන් මුහුණදෙන දුෂ්කරතාවයන්ද විමසා බැලිනි.

කියුබාව සම්බන්ධයෙන් ඇමරිකානු රාජ්‍ය ප්‍රතිපත්තිය ලිහිල් කිරීම, කියුබානු විප්ලවයට එරෙහි වූ ඇමරිකානු ප්‍රතිපත්තියේ ලිහිල් කිරීමක් ලෙස නොසැලකිය යුතු බවද නිගමනය විය. එහෙත් විවෘත වී ඇති අවකාශය තුලින් සම්බාධක ඉවත් කර ගැනීම සඳහා ජාත්‍යන්තර බලපෑම අඛන්ඩව ගෙනයා යුතු බවද තීරණය විය. ඒ සඳහා කියුබාව නිමිතිකොට ගෙන, අධිරාජ්‍ය විරෝධී අරගලය තියුණු කල යුතුය.

කියුබාව ගැන ඇමරිකානු රාජ්‍ය ප්‍රතිපත්තියේ වරදක් තිබුණු බව අමරිකානු ජනධිපති පිලිගෙන ඇත. එහි අර්ථය වන්නේ කියුබානු විප්ලවයේ ජයග්‍රහනය විනාශ කිරීම සඳහා මෙතෙක් අනුගමනය කල ප්‍රතිපත්තියේ වරදක් තිබී ඇති බවත්, ජාත්‍යන්තර වශයෙන් එයට පිලිගැනීමක් නොලැබුනු බවත් සේ සැලකිය හැක.





කියුබානු විප්ලවය හා එහි අනාගතය ගැන මෙතරම් ජාත්‍යන්තර සහයෝගිතාවයක් අවශ්‍ය වන්නේත්, එවැන්නක් තිබෙන්නේත් කුමක් නිසාද? දිගටම පවතින අධිරාජ්‍යවාදී පීඩනයත්, කියුබානු විප්ලවයෙන් දිගහැරෙන සමාජ ආර්ථික සංස්කෘතික වර්ධනයන් මගින් ජනිත කරන අශ්වාදයත් කරනකොට ගෙනය.

මෙම සමුළුවේ සත්කාරක රාජ්‍ය වූ වියට්නාමය එබඳුම අධිරාජ්‍ය විරෝධී විමුක්ති අරගලයක නියැලී ජයගත් රටක්වීම නිසා මෙවර සමුළුවෙන් අධිරාජ්‍ය විරෝධී සවිඥානකත්වය ලැබුවේ උත්කර්ෂයකි. අධිරාජ්‍ය වීරෝධී ජාත්‍යන්තර අරගලයේ එක් ජාතික බිමක් වනුයේ කියුබාව බව කිව හැකිය. එමෙන්ම වෙනිසියුලාව, ඉක්වදෝරය, බොලීවියාව හා එල් සැල්වදෝරය එබඳුම අරගලයක නියුතුව සිටින රටවල්ය.

එබැවින් වාමාංශික පාලනයක් යටතේ අධිරාජ්‍යවාදය සමඟ තරඟකාරීව පවතින රාජ්‍යයන්ට, තම රටවල ධනේෂ්වර වර්ධනය යම් සීමාවන් තුල රැඳවීමට සිදුවේ. එමගින් මූර්ත ඒකපුද්ගල ආදායම ඉහල යාමේ වේගයද සීමාකර ගැන්මට සිදුවිය හැක. ලෝක ධනපති ආර්ථික අර්බූදයේ විපාක තම රටවල් තුලට බලනොපාන සීමාවක ඉදීම මෙහි අනෙක් අදහසය.

අපි 2008 සහ 2012 කියුබානු සහයෝගිතා සමුළුවේ සත්කාරක රටවීමත් 1959 ජනවාරි කියුබානු විප්ලවයෙන් පසු එම විප්ලවකාරී රජය ආසියාවේ පලමුවෙන්ම පිලිගත් රට ලංකාව වීමද, එම වසරේම අගෝස්තු මස චේගෙවේරා සහෝදරයා ලංකාවට පැමිනීමද අපට මෙම ජාත්‍යන්තර පවුලේ වැදගත් තැනක් ලබා දුන්නේය.

මෑතක වසර 2කට නුදුරු කාලයක් ඇමරිකාවේ හිරගත කර තිබූ කියුබානු වීරයන් පස්දෙනා මුදවා ගැනීමට හැකිවීමද අධිරාජ්‍ය විරෝධී ජයග්‍රහනයකි. වීරයන් 5 දෙනාගෙන් එක් අයකුවූ අන්තෝනියෝ අප සමඟ සමුළුවට සහභාගී විය.

සමුළුවේ ප්‍රධාන සැසිවාරයේදී ලංකා නියෝජිත කණ්ඩායම වෙනුවෙන් කථාවක් කලේ කණ්ඩායමේ නායකයා ලෙස පත් කරනු ලැබ සිටි මා විසින්ය.

දෙවන කොමිෂන් සැසි වාරයන්හිදි අප කණ්ඩායමේ වැඩි දෙනා මැදිහත්විය. අවසන් ප්‍රකාශය කෙටුම්පත් කරන කොමිසමටද අප ඇතුළු විය.

අප කන්ඩායම නිරීක්ෂනය කර ඇත්තේ හැනෝයි නගරය කෘතීම ලෙස සුද්ධබුද්ධ කර නැති බවද, පදික වෙළඳුන් හා පාරේ යන කරත්තකරුවන් දැකිය හැකි බවද,. කාන්තාවන් විශේෂ ලෙස ආර්ථික ක්‍රියාකාරිත්වයේ සහභාගීවන බවත් ය. තරමක අපිලිවෙලක් පැවතුනත්, නගර අලංකාරයන් ජන ජීවිත නොසලකා සිදු නොකල යුතු බව මෙයින් පැහැදිලිවූ බවද, අප කන්ඩායමේ නියෝජිතයන් පැවසීය. ආයෝජකයන්ටද කැමති පරිදි සූරාකෑමට ඉඩ නැති අතර, ඔවුන් කම්කරු නීති හා සමාජ සුභසාධන නීති පිලිපැදිය යුතු බවද වියට්නාම් නියෝජිතයෝ කීහ.

**- වාසුදේව නානායක්කාර**

## 02 පිටුවෙන් රුපියල පහල බසී ආනයන භාණ්ඩ මිල ඉහල නගී

ඇති බව පාත් ෆයින්ඩර් දැන ගෙන සිට ඇත.
බොරු කියන්නේ රනිල්ද? පාත් ෆයින්ඩර්ද?

2010 පාදක වර්ෂය කර ගෙන දල දේශීය නිෂ්පාදිතය මැන බැලූවිට වර්ධන වේගයේ යතාර්ථය පෙන්වන බව කියයි. වසර 5 කට වරක් පාදක වර්ෂය වෙනස් කිරීම පිලිගත් ජාත්‍යන්තර ව්‍යවහාරය වුවද එය 2002 සිට සිදුවී නැත. දළ දේශීය නිෂ්පාදිතය මනින්නේ නිෂ්පාදනය හා පාරිභෝජන රටාවන් දෙස බැලීමෙන්ය. මෙය 2002 වසර පදනම් කර ගෙන දිගටම කර ගෙන යාමෙන් සැබෑම තත්ත්වය දැනගත නොහැකි බව කියවේ.

කෘෂිකර්මය දල දේශීය නිෂ්පාදිතයේ සුළු ප්‍රතිශතයක් ලෙස දැක්වීම විශේෂයකි. එමෙන්ම උද්ධමනයට (Deflator) ගලපා බැලූවිට පැරණි හා අළුත් ක්‍රමය අතර ලොකු වෙනස්කමක් පෙන්වන්නේය.
ඉරිදා ටයිම්ස් පුවත්පතේ පලවු පරිදි 8% වර්ධනයක් සඳහා පුද්ගලික අංශයේ කොම්පැනිවලින් සියයට 23 සිට 24 ක ආයෝජනයක් ද, සියයට 30 ක මූළු ආයෝජනයක් ද අවශ්‍ය බව පෙනේ. මේ සඳහා පුද්ගලික අංශය පොළඹවා ගැනීමට ඔවුන්ට ආකර්ශනීය වන නොයෙක් පියවර ගනු ඇත.
රාජ්‍ය, පෞද්ගලික, එකාබද්ධ ව්‍යවසායන් නමින් රජයේ මුදල් වලින් ඔවුන්ගේ ආයෝජනයට උපකාරවීම, ඔවුන්ගේ ලාභ සඳහා බදු සහන හා බදු විරාම සැපයීම ද, ඔවුන්ගේ පහසුව සඳහා දේශීයව පහසු ණය සැපයීම ද, කම්කරු නීති ලිහිල් කිරීම ආදිය ඒ අතර තිබිය හැකිය.
මේ සඳහා රජයේ වෙනත් මහජන වියදම් කැපීමද පලල්ම පදනමින් ජනයාගෙන් අය කරන බදු වැඩි කිරීමද අපේක්ෂා කළ හැකි බව ඉරිදා ටයිම්ස් පුවත්පත කියයි. තවද අලාභ ලබන රාජ්‍ය ආයතන වසා දැමීම හෝ විකුණා දැමීම නැත හොත් සේවකයන් ඉවත් කොට පුද්ගලික කොම්පැනි හවුල් කරගත් ව්‍යවසායන් ලෙස ඒවා පවත්වා ගෙන යාමද සලකා බලනු ඇත.
එක්සත් ජාතික පක්ෂයේ මැතිවරණ ප්‍රකාශය අනුව, රාජ්‍ය ව්‍යවසායන් සියල්ල පාලනය කරන එක සමාගමක් ඇති කිරීම සඳහා කලඑණ බසෘණ බවද පෙන්වයි. රජයේ ආදායම දල දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 17% දක්වා වැඩිකර ගැනීමටද අපේක්ෂා කරයි. මෙය ලැබිය හැකි ලෙහෙසිම මාර්ගය අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල වැඩිකිරීමය.
වාමාංශික පක්ෂ රජයේ ආදායම් වැඩිකර ගැනීමට පොදු ජනතාවට නොරිදෙන මාර්ග යෝජනා කර ඇත.

**ඉන්දීය මහ බැංකු අධිපති රාඝුරාම් රාජන් මහතා විසින් ණය අර්බුදය ගැන මෙසේ අදහස් පලකර තිබේ.**

**මන්දගාමී ආර්ථික වර්ධනය නැගී එන වෙළඳපොල ඇති රටවල් වලටත් කාර්මික රටවල් වලටත් එකවගේ නරකය. හේතුව දේශපාලන ආතතිය ඇති වීමය.**

**පවුල් රාජ්‍ය හා සමාගම් ණය බර නිසා ලොව පුරා වර්ධනය පසුබා තිබේ. වර්ධනය නැවත ඇති කිරීමට නම් ණය කපා හැර නැවත ඉල්ලුම වැඩි කල යුතුය. නැතිනම් (කළ හැකි දෙයක් නම්) තවත ණය දිය යුතුය. ණය කපා හැරීම ආර්ථික වශයෙන් පිළිගත හැකි වුවත් දේශපාලන වශයෙන් අපහසුය.**

**ඉල්ලුම වැඩි කිරීමට ඇති බාධා අතර අඩු ඉල්ලුමක් ඇති වසයට යන ජනගහනය වැඩි වීම එක් හේතුවකි. අනික විශාල ධනයක් සුළු පිරිසයක් අත තිබීම නිසා ඔවුන්ට පාරිභෝජනය කල හැක්කේ සීමිත වීමය.**

## වේ ගං ඉවුරේ කුඹුක් ගස් කැපීම ජනාධිපතිතුමාගේ පරිසර අමාත්‍යාංශයට.

රත්නපුර පල්ලේගම වේ ගඟ අයිනේ ඇති කුඹුක් ගස් වැටිය කපාගෙන ගොස් තිබේ. මෙය ගඟට හා පරිසරයට විශාල හානියකි. මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා නීතිවිරෝධී ලෙස කටයුතු කර ඇති අය හඳුනාගෙන නිසි ක්‍රියාමාර්ගය ගතයුතු බවත්, ගං ඉවුර ආරක්ෂා වීම සඳහා නැවත පැල සිටුවීම සිදුකළයුතු බවත්, ගරු ජනාධිපති හා පරිසර අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ අවධානය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර සහෝදරයා විසින් යොමු කර තිබේ. දිඹුල්වල පැවති ජනහමුවකට සහභාගී වූ අවස්ථාවේදී වාසුදේව සහෝදරයාට මෙම ප්‍රශ්ණය යොමු කරනු ලැබ ඇත්තේ නන්දන ඕපාත ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා ඇතුළු ගම්වාසින් පිරිසක් විසින්ය.

තවද ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කන්ද වත්ත අරඹ දිඹුල්වල, ඕපාතමුල්ල යන වසම්වල සීඝ්‍රයෙන් නීති විරෝධීව දැව කැපීම සිදුවෙමින් පැවතීම නිසා මෙයින් ජල මුලාශ්‍ර සිඳීයාමේ අනතුරක් පැන නැගී ඇති බවට ප්‍රදේශයේ ජනතාව බිය පළ කරති. මීට අමතරව පනංකන්ද නෑකැටිදොල ප්‍රදේශද තර්ජනයට ලක්වී ඇති බවද පැවසේ.

## අපගේ ශෝකය

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ක්‍රියාකාරී නායකයෙකු වූද, ඇහැළියගොඩ කොටාමුල්ල ප්‍රදේශයේ වාමාංශික නායකයෙකු වූද තිලක් සහෝදරයාගේ ආදරණිය පියා අප අතරින් වෙන් වි ඇත. ඒ පිළිබඳව අපගේ ශෝකය පල කරමු.

## චන්දිමාගෙන් පෙර පාසැල් පොත් පහක්



ප්‍රවීන මාධ්‍යවේදිනී චන්දිමා ඈපා සෙනවිරත්න පූර්ව ළමාවිය සංවර්ධනය උදෙසා කෘතින් පහක් සාහිත්‍ය දිනය නිමිතිකොට ගෙන එළිදක්වා ඇත. ඇය විජය ප්‍රකාශන සමාගමෙන් පළ කරන ''විජය'' ''බිලිඳු'' පුවත්පත්වල වසර දහයකට ආසන්න කාලයක් මාධ්‍යවේදිනියක් ලෙස සේවය කරන්නීය. එම ආයතනයේ අනෙකුත් පුවත්පත්වල තීරු ලිපි ලේඛිකාවක් වේ.

ඇය ළමා මෙන්ම කාන්තා විශ්‍යයෙහි සිය නිර්මාණ ඉදිරිපත් කරන්නීය. ළමයින් උදෙසා අපූරු දඩුවම නම් කෘතිය මුලින්ම පල කර ඇති අතර අනතුරුව ළමා ලොවට සරිලන පොත් කිහිපයක් ලියා ඇත. ලබු ගෙඩියේ තොවිලය. එලොව ගිහින් මෙලොව ආවා, කොහොල්ලෑ බබා, එළු අම්මාගේ උපාය ඒ අතර වේ.

ඇය කළක් ශ්‍රී ලංකා ගුවන් විදුලියේ විදුල ගුවන් විදුලියේ සැරිසර වැඩසටහනේ පිටපත් රචනයෙන් මෙන්ම වැඩසටහන් ඉදිරිපත් කිරීමෙන් එක් වූවාය.

පූර්ව ළමා විය සංවර්ධනය උදෙසා මෙවර ලියා ඇති පොත් විෂය වන්නේ ඉංග්‍රිසි, ගණිත සංකල්ප, රූප පාට කිරීම, සිංහල අකුරු පුවරු, පිටපත් කිරීම ය. මෙම කෘතින් නිකුත් කොට ඇත්තේ කර්තෘ ප්‍රකාශන වශයෙනි.

**විමසීම් 071 5624827**

- ප්‍රනාන්ද -



| | |
|---|---|
| යුගයකි යලි මතු වනුයේ | අවිචාර |
| නන් දොඩවාවි නොමැතිව | ශීලාචාර |
| නොදැමුණු නොහික්මුණු වෙස්ගත් | අවතාර |
| ඒකා අධිපතිය නැත දෙන | ප්‍රතිචාර |
| වටහා ගත නොහැකි විලසට කරපු | වැඩේ |
| බත් බැලයින් ලැග ඇත ඒ ගොහොරු | මඩේ |
| සම්මුති වාදයට එක්වී සිටින | නඩේ |
| වැටිලා දුගඳ හමනා කුණු කසල | ගොඩේ |
| වම යයි කියා ගෙන මෙතුවක් කරන | ලද |
| එඩිතර තරුණයන් බිල්ලට පුදින | ලද |
| ජ.වි.පෙ නැමැති හොර තක්කඩි අමන | යොද |
| බර ගොන් කරත්තයක් යූ.එන්.පී යේ | අද |

- ඇහැලියගොඩ සේන -

# යුදයේදී පෑරුණු හදවත් නිබඳව එසේය

## ඔබ නැතුව ඔබ එක්ක




ශ්‍රේමයෙන් රංජිත වු, මුසපත් වු, ඇය ඔහු ගැන පසක් කලේ ''ඔබ ද මා විය'' කියාය. ඔහු ''මා ද ඔබ විය'' සේ පැතුවා විය හැකිය. ඒ පැතුම් සඵල නොවීමට හේතු කාරක වුයේ යුද්ධයේදී වු අතීත සිදුවීම් මෙන්ම පශ්චාත් යුධ සමයේ අතිත යුධය ක්‍රියා කල ආකාරය හේතු කොටය. දේශපාලන අධිකාරිය නිමා වු යුද්ධය ගැන බාහිරව බලනු මිසක ඇතුලාන්තයට නොගොස් කරන ප්‍රකාශ යුධයෙන් තැලුනු පොඩිවුනු හදවත් සුවපත් කිරිමට හේතුකාරක නොවේ. යුද සමය වින්දිතයන් තාමත් සිටින්නේ අතීතයේ ජනිත සෝ සුසුම් අතරය. ඔවුන්ගේ හදවත් තුළ වචනයෙන් කියන්න බැරි දුක්‍ය සමුදායක පැටලී සිටින්නෝය. පසුගිය සමයේ යුද්ධ තේමා කර ගත් චිත්‍රපට බිහි වුවාය. මේ ගැන සඳහන් කරන්න වන්නේ අඳ බාල සිනමා කරුවන් පසුගිය සමයේ යුද්ධය සිය අර්ථය සඳහා විකුණා කෑවා මිස එමගින් යථාර්ථය පසක් නොකළ බවය. ප්‍රසන්න විතානගේ යුද්ධයේ යටගිය සැබෑ ජීව ස්පන්දනය හදුනා ගෙන නිමවු ''ඔබ නැතුව ඔබ එක්ක'' සාර්ථක චිත්‍රපටයක් සේ වචනයේ සැබෑ අර්ථයෙන්ම සඳහන් කළ හැකිය. එය විශ්ව සම්මානයෙන් පිදුම් ලබු මහර්ග චිත්‍රපටයකි.

30 වසරක සිවිල් යුද්ධයකින් ලාංකික සමාජය හෙම්බත් වුයේය. ඒ නිසාම ජනතාව අතර වැඩිපුර විෂය වුයේ සාකච්ඡාවට බඳුන් වුයේ යුද්ධයයි. පශ්චාත් යුද සමයේ හදුන්වන මෙකල සංවාද විසංවාද වලට අමතරව සිනමා කෘති නවකතා බිහි වුයේ යුද්ධය තේමා කොට ගෙනය.

රාජ්‍ය හා එල්.ටි.ටි.ය යාන්ත්‍රනය තුළ වු සියලූ කරුණු පසෙකටලා ලාංකික ගැහැණියක මිනිසෙකු තුළ යුද්ධයෙන් නිපන් විද්‍යාමාන ගති ලක්ෂණ මැනවින් විසද කරන ''ඔබ නැතුව ඔබ එක්ක'' සිනමා බස මෙන්ම වියරණය නියමාකාරයෙන් යොදා ඇති බව කිව යුතුය. අත්‍යන්තයෙන්ම එම චිත්‍රපටයේ දෙබස් වලට දී ඇත්තේ සීමිත ඉඩකඩකි. එමෙන්ම මුළු චිත්‍රපටයම ප්‍රධාන චරිත දෙකක් හා අනු එක් චරිතයකට සීමා වී ඇත. දෙබස් වලට වඩා ආංගික අභිනයක් මෙම චිත්‍රපටයෙන් පසක් වේ. ප්‍රසන්න මෙහිදි එක්කරන රූප රාමු වලින් ප්‍රකට සිද්ධින්වලින් පසක් කරන ආඛ්‍යාන රීතියකින් යුත්තය. එම රිතිය මගින් හඩාවැටෙන ගැහැණුන් මිනිසුන්ගේ දුක් අදෝනා මෙන්ම යටිසිත මැනවින් ගම්‍ය කිරිමට සමත් වු බව කිව යුතුය.

ආගන්තුක ගැහැණියක සෙල්වි (අංජලි පටෙල්) නාදුනන පිරිමියෙකු වටා ගොඩනැගුණු සංකීර්ණ ගැටුමක් තේමා කර ගත් ඔබ නැතුව ඔබ එක්ක මෙම සමාජ ක්‍රියාවලියේ ගැහැනුන් යථා ස්වරූපව ප්‍රකට කරයි. ආගන්තුක ගැහැනිය සෙල්වි උතුරු කරයේ ඉපදි යුද්ධයේ අනවතර පෙලීමෙන් වතුකරයට වන් තම පියා විදේශ ගතව සොයුරන් යුද්ධයෙන් අහිමි වු අනාථ තැනැත්තියකි. මෙවන් පසුබිමක් යුතු ඕ සමාජය දෙස බලන්නේ කවර ලෙස ද

මෙහි අඛ්‍යානය තුළ ආගන්තු ගැහැණිය මිනිසා අතර මූර්තිමත් වන විෂමතාවලින් මෙම චිත්‍රපටය තුල සමස්ථ මිනිස් සබදතා වල ස්වරූපය කියා පාති. සෙල්වි නම් ඇය කෙරෙහි ඇල්මක් ඇතිවන රන්බඩු උකස් ගන්නා සරත්සිරි (ශ්‍යාම් ප්‍රනාන්දු) එකී තරුණිය සිය වැඩිහිටියන් නාකි හම්පඩ මුදලාලි කෙනෙකුට විවාහ කර දීමට දරද්දී ඇයව එයින් ගලවා විවාහ කර ගනිති.

සෙල්වි විවාහ කර ගත්තය ද රන්බඩු වෙළෙන්දාගේ චර්යා තුල ඇගේ පාශය තුල ගැන දක්වන්නේ ඇල් මැරුණු ගතියකි. එය හුදු ලිංගිකත්වයට සීමා වු සේය. සෙල්විගේ ක්‍රියාකාරකම් ගීත නැටුම් චිත්‍රපට කෙරෙහි ලොල් වු අතර ඔහු කඩය වසා දැම්මෙන් පසු සිය කාලය ගත කරන්නේ රූපවාහිනියේ මල්ලව පොර නරඹමිනි. මේ චර්යාව තුළ ඔහුගේ යටි සිත විවරණය වන අතර ඔහුගේ අතීත ක්‍රියාකාරකම් (යුද්ධයේදී) මුසු මානසික තත්වයක වන බව පෙනී යයි.


රන් බඩු උකස් ගන්නා වසාගත් අතීතය එනම් යුද්ධ බටයෙකු කල දෑ ඔහුගේ මිත්‍ර ගාමිණිගෙන් පසක් වීමත් සමග එතෙක් පැවති සෙල්විගේ ලෝකය කඩා වැටීමට ඉරි තැලීය. මේ ඉරි තැලීම තුළ ඇය සැමිය පිලිකුල් කරන්නීය. එයින් ඔහුගේ මානසිකත්වය කඩා වැටේ.

සෙල්විගේ ආදරය අහිමි වන විට සරත් සිරිගේ හඩා වැටීම් සමාව ඉල්ලා ඇවටිලි කිරිම් විවරණය වේ. එසේ වුවද ඔහුගේ පුරුෂාධිපයේ හැගීම් සිය වචන වලින් (පරට්ටි) සෙල්විට ගසා දමයි. ඇය සිය අතීතය ගැන සරත්සිරිගේ ප්‍රකාශ තවතවත් සිත් පෑරෙන තත්වයක වේ. සෙල්වි තම සොයුරන් මරා දැමු පාර්ශවයේ අනුගාමික යුද භටයෙකු සමග විවාහ විම පමණක් නොව යහන් ගත වීම ප්‍රතික්ෂේප කරන තත්වයට පත්වන්නීය. එසේ කළ නොහැකි වු සෙල්වි සමාජයෙන් පලි ගැනීමට නොහැකි වු හෙයින් තමා තමාගෙන් පලි ගෙන සිය දිවි හානි කර ගත්තීය.

හමුදා මිලිටරිකරණය මෙන්ම සිවිල් ජනතාව පීඩනය මෙන්ම ද්‍රවිඩ ජන සිතුවිලි ක්‍රියාවන් මෙහි මනා ලෙස ගොඩනගා ඇත. මෙහි චරිතයනට පාදක වන යුද්ධය නොපෙන්වා යුද්ධයේ අකාරුණික බව පෙන්වන්නේ සෙල්විගේ මානසික කම්පනය තුලින්ය. එම කම්පනය මෙම චිත්‍රපටය තුලින් මැනවින් ගොඩනගා ඇත. චරිතයට අවැසි පරිසයට නිමවා තිබේ. මෙහි රගන අංජලී පටෙල් මෙන්ම ශ්‍යාම් ප්‍රනාන්දු සිය භූමිකාව මගින් මිනිස් සබඳතාව මැනවින් ප්‍රකාශ කරයි.

# බොරැළුගොඩ දෙවනි පරපුරේ ජ්‍යෙෂ්ඨයා

## ඉන්දික



ඉන්දික යනු සමාජවාදයේ පියා ලෙස සලකන පිලිප්ගේත්, කුසුමාගේත් ජ්‍යෙෂ්ඨ පුතනුවන්ය. ඉන්දික උපත සිදුවුයේ සුවිශේෂී වකවානුවකය. මෙරටේ අධිරාජ්‍යවාදයට එරෙහිව නැගි සිටි ඇන්.එම්, පිලිප් වැනි සමසමාජ නායකත්වය බෝගම්බර සිර ගෙදර ගාල් කිරිමට එවකට පැවති සුදු අධිරාජ්‍යවාදී රජය කටයුතු කළෝය. එවකට පැවති දෙවැනි ලෝක සංග්‍රාමයට එරෙහිවීම වීම නිසා මෙසේ සිරභාරයට ගත්තේය. ඔවුන් සිරගෙදරින් පැන යෑමට කටයුතු කලේ ඉන්දීය නිදහස් සටනට එක්වීමයට. පිලිප් ඇන්.එම්., කොල්වින්, එඩ්මන්ඩ්, මෙසේ පැන ගියේ පාස්කු ඉරිදාවකය. ඔවුන් පැන ගොස් මොම්බායේ වාසය කලෝය. මෙරට තනිවු කුසුමා පිලිප්ගේ සෙවනට යෑමට අදිටන් කර ගත්තීය.

1942 කුසුමා ඉන්දියාවට යාමට අවශ්‍ය කටයුතු සංවිධානය කලේය. එම ගමනට ලංකා සමසමාජ පක්ෂයේ රෙජී සේනානායක, ඔහුගේ බිරිඳ ෆොරලන්ස් සේනානායක, චන්ද්‍රා ගුණසේකර, එක් වු අතර කුසුමා පාසැල් සිසුවියෙකු සේ වෙස් වලා ගත්තීය. එවකට පිලිප් නැවතී සිටියේ බොම්බායේ සිවාජී පාර්ක් හි නිවාසයකය. එවක් පටන් පිලිප්ගේ සෙවනට පත් වු අතර එහිදි ඇය ගැබිණියක් බවට පත් වූවාය. පිලිප් ජෝසප් ගුරුසාමි කුසුමා මේබල් ගුරුසාමි ලෙස වෙස් වලාගෙන එවකට කටයුතු කලෝය.

1943 පෙබරවාරි 08 වෙනිදා කුසුමා සිය කුළුදුල් පුත් බිහි කලාය. ඉන්දීය - ලංකා දෙරටෙහි සම්භවය සිහිපත් කිරිමට එම පුතුට ඉන්දික යන තැබුවාය. ඔහුගේ උප්පැන්න සහතිකයේ නාමය වුයේ අමාර් ඉන්දික යන්නය. ගුරුසාමි නම ද එහි වු අතර එය වෙනස් කලේ පිලිප් ශ්‍රී ලංකාවට සැපත් වීමෙන් අනතුරුවය.

පිලිප් හා කුසුමා එවකට පැවති ඉන්දිය සුදු අධිරාජ්‍යවාදින් අත්අඩංගුවට ගත්තේ ඉන්දියා නිදහස් සටනට එක්වීම නිසාය. එහිදි පිලිප් කුසුමා සහ බිලිඳු පුත් ඉන්දික එම අත්අඩංගුවට පත් වූ පසු බයිකුල්ලා හිර ගෙදරට ගාල් කලෝය.

1943 දෙසැම්බරයේදී ඉන්දිය නිදහස් සටනේ ශ්‍රී ලංකා හිරකරුවෝ මේ රටට එවුහ. කුසුමා ඉන්දික ද එම වරප්‍රසාදයෙන් මෙරටට පැමිණියේය.

ඉන්දික මුලින්ම අකුරු කලේ මෙතොදිස්ත විද්‍යාලයේදීය. අනතුරුව කොළඹ තර්ස්ටන් විද්‍යාලය හා රාජකීය විද්‍යාලයේහි සිප්සතර හැදෑරුවේය. දේශිය චින්තනය පෙරදැරි කොට ගෙන ආරිය සිංහල ඇදුම ඇදි ශිෂ්‍ය පුරෝගාමියෙකි ඉන්දික.

ඔහු ජර්මනිය විශ්ව විද්‍යාලය අතුලත් වි කෘෂිකර්මය පිලිබඳව උපාධියක් ලබා ගත්තේය. අනතුරුව මහා බැංකුව, රබර් පර්යේෂණ ආයතනයෙන්, වෘත්තිය ජීවිතය ඇරඹුවේය. ඉන්දික 1965 දී කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකත්වය ලබා ගත්තේය. ලංකා ජාතික ශිෂ්‍ය මව් සංගමය ක්‍රියාත්මක වුයේ ඉන්දිකගේ මුලිකත්වයෙනි. එවකට අධ්‍යපන ධවල පත්‍රිකාවට එරෙහිව විරෝධතාවයක් ඉන්දිකගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය.

රජය පෙරලීමට කුමන්ත්‍රනය කලා යැයි චෝදනා මත ඉන්දික ගුණවර්ධන අත්අඩංගුවට ගන්නා ලදි.

1993 පළමු පළාත් සභා ඡන්දයට ඉන්දික ඉදිරිපත් වී මනාප අසු දහසක් ලබා ජයග්‍රාහණය කලෝය. චන්ද්‍රිකා බණ්ඩාරනායක රජය සමයේ මැති සබයට පැමිණි ඉන්දික ධීවර හා ජලජ සම්පත්, උසස් අධ්‍යාපන හා තොරතුරු තාක්ෂණ, මහජන උපයෝගිතා අමාත්‍යාශවල අමාත්‍යධූර හෙබ වුහ. ප්‍රසන්න, දිනේෂ්, ගීතාංජන ලක්මාලී යන අයගේ දයාබර සොයුර සොහෝරන් වේ.

ඉන්දික සොහොයුරාණනි ඔබට ශක්තියේ අචාරය ......

**- මොරටු පුත්‍ර -**

# මේ කොහෙදෝ යන්නේ නෑ කවුදෝ දන්නේ

මාගේ පාසැල් සමයේ බැලූ චිත්‍රපටියක් වු ''සැනසුම කොතැනද'' චිත්‍රපටයේ එන මේ ගිතය අපේ ජීවිත වලට කිසියම් බලපෑමක් එක්කළාය. මට මතකයි ගාමිණී ෆොන්සේකා දෙපා අප්‍රාණිකව රෝද පුටුවක තබා ගෙන, පියදාස ගුණසේකර රෝද පුටුව තල්ලු කරගෙන ගාළු මෝදර පිටියට එනවා. ඒ අතර කොළු රැනක් සරුංගල් අරිනවා. සුළං රැලි අතර යන සමීප රූපයක් පෙන්වලා ඒ අතරින් මේ ගීතය මිල්ටන් පෙරේරාගේ හඩින් ගීතවත් වෙනවා. එම ගීතයෙන් අසන ප්‍රශ්නය අපේ ජීවිත වලින් අසන්න අපට සිදු වෙලා තියෙනවා. එහෙම වුනේ ඇයි කියන ප්‍රශ්නය කාට කාටත් තියෙනවා.

එදා අපි නින්දෙන් අවදි කළේ සොබාදහමය. කාක් හඩ කුරුළු හඩ වගේ ශබ්ද වලින්ය. අද අපි චූන් පාන් වාහන වල ශබ්දෙන් නැගිටිනවා. අපි කොයි තරම් සොබාදහමින් ඈත් වෙලා ද .

මේ කොහෙද යන්නේ නෑ කවුදෝ දන්නේ ධර්මසිරි ගමගේ ගීතයෙන් ප්‍රශ්න කරන දේ අද අපේ ජීවිතවලට බලපානවා. අප සැමදෙනා යථාර්තය පසක් නොකරගෙන විසදුම් කියලා මායාව පසුපස යනවා. ඒ මායාව රජකරවන එක්ටැම් ගෙවල්වලට වෙලා යථාර්ථය පසකටලා මිත්‍යාව වැළඳ ගෙන අදෝනා නගනවා. මෙහිදි මුල් කාලයේ අපේ ජීවිත වැළදගත් පවුලේ මෙන්ම සමාජයේ අන්තර් සබැදියාව ගිලිහිලා ගිහිල්ලා. බල තරගය පෙර දැරි කොට ගෙන උනුන් පරයා නගින්න මනාප පොරයකට එක් වෙලා.

එදා අපි ගුවනෙන් ප්‍රචාරය වු මෛත්‍රී චින්තාවෙන් වැඩඅරඹා කරණීය මෙත්ත සුත්‍රයෙන් වැඩ අවසන් කලා. උදේම ඇහුනේ දේශාභිමාන ගීත. එහෙත් අද මොකක්ද වෙලා තියෙන්නේ. සුභාවිත ගිතයේ තිබූ අනුශාංගික දේවල් වාෂ්ප වෙලා. භාරතිය අසනන්න් පවා අපේ ගීතයන්ට ඇලූම් කළා. ඒවගේම ඉන්දීය සුභාවික ගීතයට අප සිත් බැඳුනා. ප්‍රසංගික කලාවක් එදත් තිබුණා. මේ වගේ පේමන්ට් කලාවක් ඒ වගේ තිබුණේ නැහැ. අද මේ අඳ බාලයන් ගැන සිතනවිට ඇතිවන්නේ කණගාටුවක්. අද ඕනෑම එකෙක්ට ගායකයෙක් වෙන්න පුළුවන්. සල්ලි තියෙනවානම්. සුභාවිත ගීතය තිබු තැන අද නැත්තටම නැති වෙලා. අමරදේවලා නන්දා මාලනීලා වික්ටර් රත්නායකලා නිර්මාණකරණයෙන් ඈත් වෙලා. සුනිල් ආරියයරත්න ගී ලියන්නේ නෑ.

වෙල් ඉපනැල්ලේ මෙන්ම මුහුදු වෙරළ අතර කරිජ්ජ පෑගු අපි, එහෙත් අද අපේ මුණුපුරන්නට ඒ සුන්දර ලෝකය අහිමි කරලා. ඔවුන්ගේ සමනල් ලෝකය අප හැම සොරාගෙන කියා සිතෙනවා. ටියුෂන්... ක්‍රිකට් ප්‍රැක්ට්ටිස්... එළුකියුෂන් මේ මගුල් වලින් කරන්නේ ළමා හැගිම් දැනිම් නැති වීමයි. ඔවුන් අනාගතයේදී මනුෂ්‍යකම් නැති රොබෝවරන්ගේ තත්වයට පත් වෙනවා. ළමයින්ගේ සමනල ලෝකය දේදුණු වර්ණය අප විනාශ කලේ මේ බල තරගය නිසා. පෙල පොත් වලට සීමා වෙලා ලෝකය විවෘතව බලන්නට බැරි වෙලා. සෝමලතා සුබසිංහගේ විකෘති නාට්‍ය මේ ගැන මැනවින් කථා කලා. අද ඉන්නේ මැටි මෝල්ලූ. ඒ දෙස බලන්නේ නෑහැ. විභාගේ විභාගේ ඒක තමයි අභාග්‍යය.

අද ළමයෙකු බාල අංශයට ඇතුල් කර ගන්න මොන තරම් හෙයියන්මාරුවක් කරන්න වෙලා ද? මේ හෙයියන්මාරුවට මුඛ්‍ය හේතුව වෙලා තියෙන්නේ පාසැල් වාර්ගීකරණයයි. හොදයි කියන ජාතික පාසැල ජනප්‍රිය පාසැල් ලෙස අද ලේබල් ගහලා. ඒ අතර මධ්‍යම රජයේ පාසැල් පළාත් සභා පාසැල් මේ ඔක්කෝම වර්ග කිරිමෙන් සිද්ධ වෙලා තියෙන්නේ දෙමාපියන් හොරුන් වංචාකාරයින් කරන්න. එදා තිබු කන්නංගර මැතිතුමාගේ අධයාපනයක් අද නෑ. බලවතාට පමණක් හොඳ පාසැල්වල දොර විවර වෙනවා. එදා තිබුණු මධ්‍ය මහා විද්‍යාල අද වැසී යන තත්වයකට පත් වෙලා. දෙමාපියෝ හොරට පදිංචිය තහවරු කරන්න ලේඛණ හදාගන්නවා. ඒකාලේ ගමේ ඉස්කෝලේ දුප්පත් ළමයින්ට හොද පාසැල් ගන්න තිබු ශිෂ්‍යත්ව ක්‍රමය අද අහෝසි වෙලා. හොද පාසැල් දොරවල් විවර කිරිමට බලවතුන්ගේ පුතුන්ට ශිෂ්‍යත්ව ඇති කරලා. සයිමන් නවගත්තේගමලා, කොල්වින් ගුණරත්නලා, එදා ගමෙන් ශිෂ්‍යත්වය ගත්තා. අද මේ කාලකන්නි ක්‍රමයෙන් දුප්පත් දරුවන් කොන් වෙනවා. එදා ශිෂත්වයක් ලැබීමට පවුලේ අඩු ආදායම බලපෑවා. ඒ සුදුසුකමක්.

එදා පන්සලේ භික්ෂුව දෙවි මැදුරේ පුජකයා ගිහි සමාජයේ මුදුන් මල්කඩ වුනා. අද වෙනකොට එම පූජ්‍ය පක්ෂයේ ඇවතුම් පැවතුම් නිසා ගිහියා පන්සලෙන් පල්ලියෙන් කෝවිලෙන් ඈත් වෙලා. පන්සල පිහිටෙන් විද්වත් පිරිසක් එදා සමාජයේ හිටියා. ඒ අද එදා තිබ්ච්ච පිරිවෙන වැහිලා ගිහිල්ලා. පොත් ගුල් අහෝසි වෙලා. දෙවි මැදුරේ පුජක වරුන්ද ගිහි සබැදියාවෙන් ඈත් වෙලා. වාරකන් කාලයට එදා ධීවරයට පිහිට වුයේ පල්ලිය. අද ගිහියාට පන්සල පල්ලිය මතක් වෙන්නේ මරණයට පමණි. එදා මිනිස් සමාජය සුමගට යොමු කල පුජ්‍ය පක්ෂය සුඛ විහරණවලට යටවී පන්සල් වෙනුවට අසපු යාන වාහන වලට සිමා වෙලා. ඒ වුනත් ගම්බදව තවමත් චිරාගත සම්ප්‍රදානුකූලව ගිහි සබැදියාව ගොඩනගාගෙන කටයුතු කරන දුප්පත් පන්සල තියෙනවා.

**එකක් කඩතොලූ වසා ගන්නට ගොසින් සිදුවුනු කාරියා**
**දෙකක් කඩතොලූ සදා දුන්නැයි ඉඳුරුවේ ආචාරියා**

**- වැඩෙනකොණ්ඩ ආරච්චි -**

ශක්තිය

## මාළු කාලා ඉවරයි.

**-යටියන්තොට රංජිත් පෙරේරා -**

අද මාළු මිල සීඝ්‍රයෙන් ඉහල යනවා. තලපත් කිලෝ එකක් එක්දහස් තුන්සීයයි. තෝරා මාළු කිලෝව එක්දහස් පන්සීයයි. සාලයෝ කන්නත් බැහැ. පිට කළු සාලයෝ කිලෝව රුපියල් හාරසියයි. ලාභෙටම තිබුණු මාළු. දුප්පත් මිනිහෙකුට මාළු කන්න බැහැ. ආණ්ඩුවෙන් කියල කිසිම වැඩ පිලිවෙලක් නැහැ. දරුවන්ට කන්න දෙන්න තියෙන්නේ මාළු කෑල්ලක් විතරයි. ඇඟට පෝෂණය දෙන මාළු කැල්ලක් දෙන්න විධියකුත් නැහැ. සැප කෑම දෙන්න අපට හයියකුත් නැහැ. ආණ්ඩුව කිව්වේ නම් පෝෂණ ආහාර අඩු මිලට පහසුවෙන් ලබා දෙනවා කියලා. දැන් තිබුණ පෝෂණයත් නැහැ.

# රුවන්පුර ජනබලය පෙරට
# නිල බලයට යට නොවන ජනබලයක්

## ඒකාබද්ධ ආණ්ඩුව ජනතා බලය මැඩලීමටයි - වාසුදේව






- තේ, රබර්, වී වලට සහතික මිලක් දියව්
- මැණික් වලට වෙළඳපොලක් හදා දියව්
- නැවැත්වූ සංවර්ධනය යලි අරඹව්
- යූ.ඇන්.පී.මෛත්‍රී හවුල් පෙරමුණ අපට එපා
- පලාත් පාලන නියෝජිතයින්ට බලය දියව්
- යූ.ඇන්.පී. විරෝධී ජනතා අරගලයට ජයවේවා
- එක්සත් ජනතා නිදහස් සන්ධානයට ජයවේවා

රත්නපුර දිසාවේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මැතිවරණ ක්‍රියාකාරී නියෝජිතයින් දහසක පිරිසක් පසුගියදා රුවන්පුර නගර ශාලාවට එක් රැස්වී ඒකරාශී වෙමු. දැනුවත් වෙමු. පෙල ගැසෙමු. යන තේමාව යටතේ මහා සමුළුවක් පැවැත්විය.

### රුවන්පුර ජනතාවගේ එකම හඬක්

මෙම සමුළුව මුලපිරුනේ වාසුදේව නානායක්කාර සහෝදරයා පෙරමුණ ගත් ඡන්ද ව්‍යාපාරය මෙහෙයූ ප්‍රාදේශීය නායකයින් 40 දෙනෙකු පමණ රැස්වී ගනු ලැබූ තිරණයක් අනුවය. ඊනියා ජාතික ආණ්ඩුවට සම්බන්ධ නොවූ සන්ධානයේ මන්ත්‍රීවරුන් සමඟද සාකච්ඡා කර සමුළුවට අවශ්‍ය සංවිධාන පියවර ගෙන තිබුණි. සමුළුවේ පිලිගැනීමේ කථාව සිදු කරමින් පළාත් සභා මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය සහෝදරයා ප්‍රකාශ කලේ මෙම සමුළුව කැඳවීමට පදනම වූයේ යූ.ඇන්.පී.-මෛත්‍රී හවුල් පෙරමුණට එරෙහි වූ සියළුම පළාත් පාලන හා පළාත් සභා නියෝජිතයින් බවය.

### සක් නඬ සමඟ බෙර හඬ

සමුළුව ආරම්භයේ සම්ප්‍රදායික පොල්තෙල් පහන දැල්වෙන විට සක් නඬ සමඟ මුසුවූ බෙර වාදනයෙන් සභාව ගිගුම් දෙන්නට විය. පක්ෂ නායකයින්ට, පළාත් සභා මන්ත්‍රීවරුන්ට, පළාත් පාලන නියෝජිතයින්ට පොල්තෙල් පහන දැල්වීමට ආරාධනය ලැබුණි.

සමුළුවේ අරමුණු පැහැදිලි කරමින් කථා කළ පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව සහෝදරයා පෙන්නා දුන්නේ ජනාධිපතිවරණයේ හා මහ මැතිවරණයේ ලැබූ සුළු පරාජය නිසා නිදහස් සන්ධාන ආණ්ඩුව වෙනස් වුවත්, ජනතාවගේ අපේක්ෂාවන් යූ.ඇන්.පී. - මෛත්‍රී දක්ෂිනාංශික හවුල් ආණ්ඩුවකින් ඉටුකර ගත නොහැකි බවයි. එබැවින් යූ.ඇන්.පි.- හවුල් ආණ්ඩුවට එරෙහිව විපක්ෂය ලෙස ඉදිරියටත් කටයුතු කිරීමට මන්ත්‍රීවරුන් 50ක පමණ පිරිසක් සිටින බව සමුළුවේ අත්පොලොසන් හඬ මධ්‍යයේ ප්‍රකාශ කලේය. අපගේ නිදහස් සන්ධානය යූ.ඇන්.පි.යට පාවා දුන් අය හැර ඉතිරි මන්ත්‍රීවරුන් ජනතා අපේක්ෂාවන් ඉදිරියට ගෙනයාමට තීරණය කළ බවද නියෝජිතයින්ගේ ඔල්වරසන් හඬ මධ්‍යයේ වාසුදේව නානායක්කාර මන්ත්‍රීවරයා ප්‍රකාශ කලේය. සුළු පිරිසකගේ කුමන්ත්‍රණයෙන් මෛත්‍රීපාල සභාපති ධූරයට පත් කොටගෙන ශ්‍රී ල.නි.ප.යේ හා සන්ධානයේ නිල බලය අයිති කරගත්තත් සන්ධානයේ ජන බලය මෛත්‍රීපාලගේ නායකත්වයට එරෙහිව තවමත් මහින්දගේ සෙවනැල්ල පසුපස ගමන් කරන බවද ඔහු පැවසීය.

### ග්‍රාමීය ජනතාවගේ ආදායම් පහලට

තේ,රබර්,මැණික් සඳහා මෙතෙක් ලැබුණු මිළ ගණන් වර්තමාන රජය බලයට පත්වී මාස ගණනක් ඇතුලත කඩා වැටී තිබේ. ව්‍යාපෘති නැවතී ඇති නිසා ග්‍රාමීය ජනතාවගේ ආදායම් තත්වය පහල වැටී ඇති බවත්, වැලි ගොඩදා එදා වේල සොයාගත් පිරිස පවා අනාථ තත්ත්වයට පත්ව ඇති බවත් ශ්‍රී ලංකා මහජන පක්ෂයේ සභාපති, පළාත් සභා මන්ත්‍රී ජී.එම්. කරුණාපාල සහෝදරයා ප්‍රකාශ කලේය.

සමුළුව අමතමින් ලංකා සමසමාජ පක්ෂයේ නායක මහාචාර්ය තිස්ස විතාරණ සහෝදරයා ප්‍රකාශ කලේ 1953 හර්තාලය මතුවූ එදා පසුබිම මෙවරත් යූ.ඇන්.පී. හවුල් ආණ්ඩුව සහ පාලක පංතිය එකට එකතුවී නිර්මානය කරමින් සිටින බවය. රටේ ආර්ථිකය කඩා වැටිලා. ජනතාව මහපාරට වැටෙන තත්ත්වයක්. ඊට අමතරව රට අධිරාජ්‍යවාදීන්ගේ දෙපතුල ලඟ පාවා දෙන්න හදනවා. සටන්කර පාලකයින් පලවා හැරීම මිස වෙනත් මාවතක් නැහැ.

### රට අනතුරක

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ලේකම් ඩිව් ගුණසේකර සහෝදරයා කථා කරමින් කියා සිටියේ නව ලිබරල්වාදයේ බලපෑමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය හසු වෙමින් ඇති බවයි. එනිසා ඔවුන් යූ.ඇන්.පි.ය සමඟ සන්ධානයකට ගමන් කරලා. මේ නිසා අලුත් තත්ත්වයක් නිර්මානය වෙලා තිබෙන්නේ. ධනපතියන්ගේ උවමනාව අනුව පොදු ජනතාවගේ කරපිට බදු පටවන එකටයි. ඒ නිසා මොවුන්ගේ ක්‍රියාමාර්ගවලින් රට අනතුරකට පත්වනවා. විශේෂයෙන් යෝජනා ක්‍රියාවලිය ඇමරිකාවට යටත්වීමක්.

### ජනතා අනුමැතියක් නැති ආණ්ඩුවක්

ශ්‍රී ල.නි.පක්ෂයේ රක්වාන සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් සොයිසා මැතිතුමා සමුළුව අමතමින් කියා සිටියේ යූ.ඇන්.පි.ය සමඟ ආණ්ඩුවකට එකතුවීමට, සන්ධානයට ඡන්දය දුන් ජනතාවගෙන් අනුමැතියක් නොලැබුණු බවය. එනිසා ජනතාවට පිටුපා ආණ්ඩුව කටයුතු කිරීම ආරම්භ කරලයි තිබෙන්නේ. අප ආණ්ඩුවට සම්බන්ධ නොවන්නේ ජනතාවට පිටුපාන්න බැරි නිසා. වර්තමාන දක්ෂිනාංශික ආණ්ඩුවේ කිසිදු තනතුරක් ලබා නොගෙන මෙම ආණ්ඩුව විසින් සිදු කරන වැරදි ක්‍රියාවන්ට විරුද්ධව සටන්වැදීම අපගේ ක්‍රියාමාර්ගය වී ඇති බවත්. වාසුදේව සහෝදරයා විසින් ගනු ලැබූ මෙම පියවර ඉතා වැදගත් බවත් ඉදිරියේදී දිස්ත්‍රික්කය පුරාම මෙම සාකච්ඡාව ගෙන යමින් ජනතාවට හිතවත් පියවර ගැනීමට රජයට බල කරන ක්‍රියාකාරිත්වයක් ඇති කළ යුතු බවද ප්‍රකාශ කලේය.

ජාතික නිදහස් පෙරමුනේ රත්නපුර දිස්ත්‍රික් සංවිධායක පළාත් සභා මන්ත්‍රී දීපාල් ගුණසේකර සහෝදරයා අදහස් දක්වමින් කියා සිටියේ කුමන්ත්‍රණය පැහැදිලි ලෙස ජනතාව අතරට ගමන් කරමින් තිබෙන බවය. යූ.ඇන්.පි.ය සමඟ එකතු වූ ශ්‍රී ල.නි.ප.දක්ෂිනාංශික නායකයින් ජනතාව පමණක් නොව රටත් පාවාදෙන්න යනවා. එනිසා විපක්ෂය ඒකාබද්ධ වෙමින් සටන් කළ යුතුයයිද ඒ සඳහා රත්නපුර දිස්ත්‍රික්කයෙන් අපගේ ශක්තිය එකතු කරන්න සූදානමින් සිටිනවායයිද පැවසීය.

### සන්ධාන රජයක් පිහිටුවීමු

සභාව හමුවේ තේ,රබර්,වී,කුරුඳු හා මැණික්මිල පහල යාම ගැනත්, අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ඉහලයාම පිලිබඳවත්, තේ, රබර් සඳහා සහතික මිළක් හා මැණික් සඳහා වෙළඳ පොලක් ඇති කරන ලෙසත්, රජයේ සේවක දීමනා වැටුපට එකතු කරන ලෙසත්, පුද්ගලික අංශයේ සේවකයින් සඳහා රු.2500/- පඩිවැඩිවීම පණතක් මගින් ක්‍රියාත්මක කරන ලෙසත්, සමෘද්ධි සහන වැඩි කරන ලෙසත්, සංවර්ධන ව්‍යාපෘති අරඹන ලෙසත්, එක්සත් ජාතික පක්ෂ රජයෙන් ඉවත්වී සන්ධාන රජයක් පිහිටුවීමට ශ්‍රී ල.නි.ප. මන්ත්‍රීවරුන්ට බල කරන ලෙසත් ඇතුළු කරුණු අඩංගු යෝජනා හයක් සමුළුවට ඉදිරිපත් කරන ලද්දේ ඇඹිලිපිටිය නගර සභාවේ ශ්‍රී ල.නි.ප.යේ.හිටපු සභාපති අමිල මැතිතුමා විසිනි. එම යෝජනා සභාවේ ඒකච්ඡන්දයෙන් සම්මත විය.

ඉන් පසුව සමුළුව කැඳවීමට මුල් වූ ප්‍රාදේශීය නායකයින්, හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්, උප සභාපතිවරුන් හා සභාපතිවරුන් විසින් යෝජනා පදනම්ව අදහස් දැක්වීම ආරම්භ විය. එයින් අනතුරුව සභාවේ විවෘත සාකච්ඡාවකට අනෙකුත් නියෝජිතයින්ටද අවස්ථාව සැලසුනි. ඒ අතරතුර උද්වේගකර කථා, කවි මෙන්ම මුරුංගයායේ සූරිය දිසානායක කිවිඳු රබානක් වයමින් ඉදිරිපත් කළ තියුණු උපහාසය රැගත් විරුඳු ගායනයෙන් මුළු සභාව ප්‍රමෝදයට පත් කලේය.

සමාප්ති කථාව වාසුදේව නානායක්කාර සහෝදරයා විසින් පැවැත් වූ අතර, යූ.එන්.පී මෛත්‍රී ආණ්ඩුව සූදානම් වන්නේ ජන බලය නිලබලයෙන් මැඩලීමට බවත්, එයට මුහුණ දීම සඳහා ඉදිරි පළාත් පාලන මැතිවරණයේදී යූ.ඇන්.පී. මෛත්‍රී හවුල් පෙරමුණ පරාජය කිරීමට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලැයිස්තු සකස් කර ගන්නා ලෙසත් නිල බලය බුලත් කොලය හා ලකුණ අපට නැතත් සුදුසු ලකුණක් ලබා ගෙන අප සන්ධානයේ නාමයෙන් සන්ධානය උදෙසා තරඟ වැදිය යුතු බවද ප්‍රකාශ කරන ලදි. අවසානයේ සියළු දෙනා එක්වී සටන්පාඨ කියමින් සටන්කාමී ගී හඬ මැද සමුළුවේ වැඩකටයුතු නිමාවිය.

සමුළුවේ පසුපස තිරයේ මහින්ද මහතාගේ රූපයත් සමග රුවන්පුර ජනතාව සමඟ පෙරට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ක්‍රියාකාරින්ගේ මහ සමුළුව යනුවෙන් සඳහන් විය. මෙම සමුළුවට සුභ පැතීම සඳහා බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රී ගරු ලලිත් එල්ලාවල මැතිතුමාද වේදිකාවේ අසුන් ගෙන සිටියේය. බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ උප සභාපති හා කෑගල්ල දිසාවේ ක්‍රියාකාරි සගයන්ද පැමිණ සිටීම විශේෂ සිද්ධියක් විය.




අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය මෙතෙක් නොවිසඳී ඇති අධ්‍යාපන හා සුභසාධන ගැටළු රාශියක් මුල් කර ගෙන අදාල අමාත්‍යවරුන්ගේ වෙත විශේෂ අවධානය යොමු කරමින් ශිෂ්‍ය නායක ලහිරු වීරසේකර මහතා විසින් ලිපි යවා තිබේ.

මේ පිලිබඳව පිලිතුරක් යවමින් ප්‍ර.වාමාංශික පෙරමුණේ ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව සහොදරයා ''අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය විසින් නිදහස් අධ්‍යාපනය රැක ගැනීම සඳහා ගෙන යන ලද අධිෂ්ඨානසහගත අරගලයට ආචාර කරමි. අගය කරමි.'' දන්වා යවා ඇත.

රුපියල් 2000ක් වූ ශිෂ්‍යාධාර වාරිකය රු.5000/- දක්වා වැඩි කරන ලෙස වසර ගණනාවක සිට සිසුන් ඉල්ලුම් කලත් එයට නිසි ප්‍රතිචාරයක් ලැබී නැත. එබැවින් මෙම දැවෙන ප්‍රශ්න වාහා විසඳිය යුතු බව ආණ්ඩුවට දන්වමින් සිටියි.

කොළඹ 10, විනයාලංකාර මාවත, 49/1 එඩ්වින් මුද්‍රණාලයේදී, මුද්‍රණය කර ප්‍රකාශ කරන ලදී.